ජාතික පර්යේෂණ සභාව

ශ්‍රී ලංකාව

"ආර්ථික සංවර්ධනය උදෙසා පර්යේෂණ"

# වාර්ෂික වාර්තාව

# 2011




ජාතික පර්යේෂණ සභාව

380/71,බෞද්ධාලෝක මාවත

කොළඹ

දුර: 011-2697538 ෆැක්ස් : 011-2697166

ඊ මේල්: nrc@sltnet.lk වෙබ්: www.nrc.gov.lk



# ජා. ප. ස. වාර්ෂික වාර්තාව 2011

## පටුන


- දැක්ම, මෙහෙවර, පරමාර්ථ
- සභාපතිගේ පණිවුඩය
- සභාවේ හා සේවක මණ්ඩලයේ තොරතුරු
- විධායක ලේකම්ගේ වාර්තාව
- පසුගිය වර්ෂ 3ක මූල්‍ය ප්‍රගතිය
- පශ්චාත් උපාධි සහ පර්යේෂණ ප්‍රධාන වැඩසටහන
- විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන
- ආයතන ඇගයීමේ වැඩසටහන
- මාධ්‍ය හා සංවර්ධන වැඩසටහන
- මූල්‍ය ප්‍රකාශන 2011
- විගණකාධිපති වාර්තාව



ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව

380/71, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 • දුර: 011/-2697538 ෆැක්ස්: 011-2697166 .

ඊ මේල් : nrc@sltnet.lk • වෙබ් : www.nrc.gov.lk

## දැක්ම

"දැනුම හා විද්‍යාව පදනම් කරගත් සංවර්ධිත රටක
තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම"

## මෙහෙවර

"මූලික හා ප්‍රායෝගික පර්යේෂණ ප්‍රවර්ධනය,
මූල්‍යායනය හා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය සහ ශ්‍රී
ලංකාවේ මානව සම්පත් වර්ධනය තුලින්
දැනුම හා විද්‍යාව පදනම් කරගත් සංවර්ධිත රටක
තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම"

# අරමුණු

- පෞද්ගලික අංශයේ හා කර්මාන්ත වල නියෝජනය මෙන්ම ශූර නිෂ්පාදක කුසලතාවයෙන් යුතු වියතුන්ගේ සහභාගිත්වය ජාතික පර්යේෂණ සභාවට ලබා ගැනීම;
- උසස් පර්යේෂණ උපාධි සඳහා ලියාපදිංචිව සිටින පර්යේෂණ සිසුන්ගේ අවශ්‍යතා සැපයීමෙන් සියළුම විද්‍යාත්මක දැනුම් ක්ෂේත්‍රයන්හි මූලික හා ව්‍යවහාරික පර්යේෂණ ප්‍රවර්ධනය හා මානව සම්පත් සංවර්ධනයට පහසුකම් ඇති කිරීම;
- රාජ්‍ය අංශයේ සෑම විද්‍යාත්මක පර්යේෂණ ආයතනයකටම පර්යේෂකයින්ගේ පර්යේෂණ ප්‍රයත්නය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම;
- රාජ්‍ය අංශයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි තනි තනි පර්යේෂණ කටයුතුවලට පහසුකම් සැලසුම් කිරීම හා කාර්ය සාධනය ඇගයීමට ලක් කර එකී පර්යේෂණ වලට අවශ්‍ය මුදල් යෙදවීමට කලින් කලට ජනාධිපති කාර්යාලය මගින් මහා භාණ්ඩාගාරයට නිර්දේශ කිරීම;
- රාජ්‍ය අංශයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන හා විශ්ව විද්‍යාලවල පර්යේෂකයින් අතර උපාධි ප්‍රදානය අරමුණු කොට ක්‍රියාත්මක කෙරෙන සහයෝගී වැඩසටහන් ප්‍රවර්ධනයට ඒවාට අවශ්‍ය මුදල් යෙදවීම හා ඒවාට පහසුකම් සැලසීම;
- කර්මාන්ත ව්‍යාපාර විශ්ව විද්‍යාල හා රාජ්‍ය අංශයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර පැවැත්වෙන හවුල්කාරී වැඩසටහන් ප්‍රවර්ධනය හා ඒවාට පහසුකම් සැලසීම;
- සාර්ථක පර්යේෂණ හා නවීකරණයන් සඳහා ජාතික මට්ටමේ පිළිගැනීම හා ප්‍රදානයන් සිදුකෙරන ක්‍රම ඇති කිරීම; හා
- ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන අවශ්‍යතාවන්ට ඵලදායී ප්‍රතිචාරයක් දක්වන විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාමය පර්යේෂණ සංස්කෘතියක් හා ප්‍රජාවක් පෝෂ්‍ය කිරීම හා පවත්වාගෙන යාම.



# ජා. ප. ස. වාර්ෂික වාර්තාව 2011

## සභාපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ පර්යේෂණ මූල්‍යනය කිරීමේ ප්‍රමුකතම ආයතනය වන ජාතික පර්යේෂණ සභාවේ 2011 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ජාතික පර්යේෂණ සභාව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් සිය ව්‍යාවස්ථාපිත බලතල යටතේ මහින්ද චින්තන ඉදිරි දැක්ම සංවර්ධන සැලැස්ම ඉටුකරගැනීම සඳහා පිහිටුවා ඇත.

2011 වර්ෂය තුල ජාතික පර්යේෂණ සභාව පර්යේෂණ ප්‍රදාන හා පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන නව පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතීන් 51 ආරම්භ කරමින් ඉදිරියට ගෙනගිය අතර පශ්චාත් හා දර්ශනවේදී උපාධි සිසු සහයෝගීතාවන් 53ක් ආරම්භකරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇගයීමේ අවසාන ඇගයීම් වාර්තාව සභා සාමාජිකයන්ට ඉදිරිපත් කිරීමෙන් පසු අතිගරු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාට ලබාදෙන ලදී. ඇගයීමේ ඉදිරි පියවර ආරම්භකිරීම සඳහා අදාල අමාත්‍යවරුන් හා නිලධාරීන්ගෙන් සුසැදි රැස්වීමක් ද ජනාධිපති කාර්යාලයේ දී සංවිධානය කරන ලදී. වාර්තාවේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එකඟතාවය පලකරන ලදී. 2007, 2008, හා 2009 වසරවල සිදුකරන ලද විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ලබාදීමේ වැඩසටහන ආරම්භකරන ලදී. නම්නීකරනය සඳහා පර්යේෂණ පත්‍රිකා තෝරාගැනීම, කතුවරුන් හඳුනාගැනීම, සමුච්චිත අනුක්‍රමිකතාවය ගණනය කිරීම, මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීම අදාල කාලය තුල සිදුකෙරුණි. ජාපස 2011 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා සංවර්ධන වැඩසටහන් හා 2012 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශන පූර්ව සංවර්ධන වැඩසටහන් ලෙස සංවර්ධන වැඩසටහන් ගණනාවක් පැවැත්වීමෙන් හා ආජන්ම මන්ද තයිරොයිඩතාවය හඳුනාගැනීමට නවජ ලදරුවන් පරීක්ෂා කිරීම මොනරාගල දිස්ත්‍රික්කයට හඳුන්වාදීම ආදී මාධ්‍ය හා සංවර්ධන වැඩසටහන් මගින් ජාතික සංවර්ධනයට හා විද්‍යාවන් ප්‍රචලිත කිරීම සඳහා ඉමහත් ලෙස දායක විය. පර්යේෂණයන්ගේ ප්‍රතිඵල ජනතාගත කිරීමට 2011 වසරේදී පුවත්පත් ලිපි ගණනාවක් පලකරන ලදී.

නව අමාත්‍ය ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මැතිණියට, නියෝජ්‍ය අමාත්‍ය ගරු ෆයිසර් මුස්තපා මැතිතුමාට හා අමාත්‍යංශ ලේකම් ධාරා විජයතිලක මැතිණියට ජාතික පර්යේෂණ සභාව වෙනුවෙන් දැක්වූ සහයෝගය වෙනුවෙන් ප්‍රණාමය පුදකරමි.

මම මෙම අවස්ථාව ජාතික පර්යේෂණ සභා සමාජිකයන්ට ඔවුන් දැක්වූ අඛණ්ඩ සහයොගය වෙනුවෙනුත් වසර පුරාවට ඉහත දැක්වූ බොහෝ ජයග්‍රහණ ලබාගැනීම සඳහා ජාතික පර්යේෂණ සභාවේ විධායක ලේකම් විසින් දැක්වූ මූලිකත්වය, නොපසුබට උත්සාහය හා දක්ෂතාවයට ස්තුතිකිරීමටත් යොදාගනිමි. ජාතික පර්යේෂණ සභාව පර්යේෂණ මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා විද්‍යාත්මක සංවර්ධනයට දක්වන වර්ධනීය හා අඛණ්ඩ දායකත්වය මම විශ්වාසයෙන් අපේක්ෂාකරමි.

මහාචාර්ය ඊ. එච් කරුණානායක
සභාපති

# සභාව සහ කාර්යමණ්ඩලය - කෙටි හැඳින්වීමක්



විද්‍යාජෝති මහාචාර්ය එරික් එච්. කරුණානායක

සභාපති

B.Sc (Cey), M.Sc ( Lond), DIC.,

PhD (Lond) F. I Chem. C. Chem.



මහාචාර්ය ඩබ්. ඒ. ජේ. එම්. ද කොස්තා

B.Sc Agric (Peradeniya), PhD (Reading) UK



මහාචාර්ය ඩබ්. ප්‍රියාන් එස්. ඩයස්

B.Sc Eng(Hons), PhD(Lond), DIC, CEng, FIE(SL), MIStructE, FNAS(SL)



මහාචාර්ය කීර්ති තෙන්නකෝන්

B.Sc (Ceylon), M. Sc (Hawaii) USA , PhD (Hawaii) USA



මහාචාර්ය එම්. අයිරා තාබෘ

B.Sc. Hons. (Cey), Ph.D. (So’ton, UK), C.Chem., F.I.Chem.C., FNAS (SL)



මහාචාර්ය ඊ. ආර්. ජැන්ස්

B.Sc (Hons) (Ceylon), PhD Dalhouse



මොක්සෙව් ආර්. ප්‍රීලිස් මහතා

B.Sc(Engr., Cey.), MS( IE & Mgmt.,.Purdue)

ISMP(Harvard B S), M.I.Mech.E-C.Eng.(Lond),F.I.E.(Sl)

F.I.B(Sl).

# සභාව සහ කාර්යමණ්ඩලය - කෙටි හැඳින්වීමක්



විද්‍යාජ්‍යෝති මහාචාර්ය එම්. ඒ. කරීම්

B,Sc (Ceylon), PhD. (Chelsea) UK



විද්‍යාජ්‍යෝති මහාචාර්ය එච්. ජනක ද සිල්වා

MBBS (Colombo), MD (Colombo), DPhil (Oxford), FRCP (London), FRCP (Edinburgh), FCCP, FNAS (SL), Hon. FRACP, Hon. FRCP (Thailand)

මහාචාර්ය කේ. කන්දසාමි

B.Sc (Cey) PhD(Keele) Eng.





ආචාර්ය ජී. ඒ. එස්. ප්‍රේමකුමාර

B.Sc (Colombo), PhD Colombo)MIBiol CBiol MIChemC

මහාචාර්ය අරුණි තිලකරත්න

BDS, Ph D, Dip (Coun)

දේශමාන්‍ය ඉන්ජිනේරු ආචාර්ය නිහාල් ජිනසේන

D.Tech (H.C), B.Tech (Eng). D.L.C. (Hons). C.Eng, F.I.E.S.L



වෛද්‍ය එස්. රාජපක්ෂ

MS (Sri Lanka); FRCOG (UK)

# සභාව සහ කාර්යමණ්ඩලය - කෙටි හැදින්වීමක්

**ජාපස කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| **ලේකම්** | **එම්. සී. රාජපක්ෂ** |
| **ගණකාධිකාරී :** | **එන්. එස්. හේවාගම** |
| **විද්‍යාත්මක නිලධාරී:** | **එම්. එස්. මාලියද්ද** |
| **සහකාර ගණකාධිකාරී:** | **ස. කු. ගම්හේවා** |
| **ගිණුම් සහකාර:** | **ඒ. කේ. ඩී. එම්. පෙරේරා** |
| **වැඩසටහන් සහකාර:** | **ජී. එල්. ආර්. එස්. කරුණාතිලක** |
| **රියදුරු:** | **කේ. කේ. ටී. සඳරුවන්** |
| **රියදුරු/කාකාස:** | **ඒ. ඩී. ගුණවර්ධන** |

# විධායක ලේකම්ගේ වාර්තාව

ජාතික පර්යේෂණ සභාව ශ්‍රී ලංකාවේ උසස් විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම සඳහා  අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ විධිවිධාන යටතේ විධිමත්ව පිහිටවන ලද ජාතික මූල්‍යාන ආයතනයකි. සභාපති හා සභා සාමාජිකයින් මගින් එහි කාර්යයන් පාලනය කරනු ලැබේ.

2011 වසර තුලදී  ජාපස පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන, විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන, පර්යේෂණ හා සංවර්ධනය උදෙසා රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන, ආයතන ඇගයීමේ වැඩසටහන, ක්‍රියාත්මක විය. 2011 වසර තුල  පර්යේෂණ  ජාතික පර්යේෂණ සභාවට ඉතා වැදගත්වන අතර ඒකාබද්ධ අරමුදලින් වැඩිම මුදල් ප්‍රමාණයක් ලැබූ වර්ෂය විය. පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා ඉතා විශාල අයදුම්පත් ප්‍රමාණයක් ලද අතර පශ්චාත්/දර්ශනවේදී උපාධි සහයෝගිතාවන් 67 ක් ප්‍රදානය කළ හැකි විය.

සමාජ ආර්ථික සංවර්ධනය හා විද්‍යාත්මක දැනුමේ සංවර්ධනය උදෙසා දායකවන පර්යේෂණ ව්‍යාපෘති 90කට වඩා වැඩි ප්‍රමාණයක් පරිපාලනය, පාලනය, ඇගයීම ජාපස මගින් සිදුකරයි. පශ්චාත් / දර්ශනවේදි උපාධි පුහුණු වැඩසටහන ප්‍රදානය කරන ලද පශ්චාත් / දර්ශනවේදි සහයෝගීතා ගණන 15 සිට 80 දක්වා වැඩිකරමින් තවදුරටත් ඒකමිතික කරන ලදී.  විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන වැඩසටහනේ විද්‍යාඥයන්ගේ තොරතුරු සැකසීම සිදුකරන ලදී.  ජනාධිපති ලේකම්තුමා විසින් සිදුකරන ලද ඉල්ලීම මත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇගයීමට ලක්කර වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයට ලබාදෙන ලදී.

වසර පුරා ජාපස ජාතික වැදගත්කමින් යුතු බොහෝ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් මූල්‍යානය කරන අතර තේ වල පරිවෘත්තීය සැකැස්ම අධ්‍යයනය, සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වැවීම,,කුරු පොල් ජාන අධ්‍යයනය,  ජෛව පලිබෝධනාෂක, අකුණු පරිසරය, භාෂා අක්ෂර පරිවර්තනය, අස්ථි බද්ධය, මාරාන්තික වකුගඩු රෝගය, ආජන්ම මන්දතයිරොයිඩතාවය, පිටි මකුණා පාලනය, අපරාද හඳුනාගැනීම, ඩෙංගු, ඩොලමයිට් සඳහා අගය එකතුකිරිම, හා මීතේන් විමෝචනය ආදිය  වේ.

ජාතික පර්යේෂණ සභාවේ සියළුම මානව හා භෞතික සම්පත් ඊට පවරා ඇති අරමුණු ඉටුකිරීමට යොදවා ඇති අතර, සිය පර්යේෂණ උදෙසා කැපවී ක්‍රියාකරන හා ජාපස හා එක්ව ශ්‍රී ලංකාවේ පර්යේෂණ සංස්කෘතියක් ඇතිකිරීමට ක්‍රියාකරන සියළුම පර්යේෂකයන් වෙත මගේ ස්තූතිය පුදකරමි. ඔබද ඒ සඳහා ක්‍රියාකරනු ඇතැයි අප අපේක්ෂා කරන අතර අපට ඔබේ සහයෝගය ඉදිරියේ දි වඩාත් අවශ්‍යවනු ඇත. අපගේ ශක්තිය අපගේ විද්‍යාඥයන් බව මම තරයේ විශ්වාස කරමි .

ජාපස ප්‍රදාන මගින් සිදුකරන පර්යේෂණයන් තුලින් දරන ආයෝජනයන්ට ඉහල ප්‍රතිලාභයක් ලැබෙන පරිදි පර්යේෂණයන් ඉටුකරන බවට වගබලාගැනීමට ජාපස කාර්යාලය නොමදව කැපවී සිටිමු.

මම මෙම අවස්ථාවේ දී පර්යේෂණ සභාවේ සාමාජිකයන්ට ඔවුන් ජාපස වෙනුවෙන් දැක්වූ අනගි දායකත්වයට හා වසර පුරාවටම දැක්වූ සහයෝගය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාශයට ද මගේ ප්‍රනාමය පුදකිරීමට කැමැත්තෙමි.

වාර්ෂික වාර්තාව ඔබට ඉදිරිපත්කරන මෙම අවස්ථාවේ දී ජාතික පර්යේෂණ සභාවේ මෙන්ම මගේ ද සුභාශිංසනය ඔබසැමට පිරිනමමි.

මනිෂා සී රාජපක්ෂ
විධායක ලේකම්

# පසුගිය වර්ෂ 3ට අදාල මූල්‍ය සුවිශේෂීතාවයන්

පසුගිය වර්ෂ 3 හි මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය

| වැඩසටහන් / මූලෝපාය | භෞතික ප්‍රගතිය | | | | මූල්‍ය ප්‍රගතිය රු. මිලියන | | |
|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | 2009 | 2010 | 2011 | 2009 | 2010 | 2011 |
| ජා.ප.ස.වේ පොදු පරිපාලනය | | | | | 6.8 | 5.7 | 6.3 |
| පහත වැඩසටහන් සඳහා සංවර්ධන ආධාර | | | | | 70.9 | 64.5 | 213.9 |
| පර්යේෂණ ප්‍රදාන හා පශ්චාත් උපාධි වැඩසටහන | තෝරාගත් පර්යේෂණ ප්‍රදාන ගණන / අයදුම්පත් ගණන<br><br>පශ්චාත් උපාධි සිසුන් | 22 පර්යේෂණ ප්‍රදාන 22 හා 7 පශ්චාත් උපාධි ප්‍රදාන 7ක් අයදුම්පත් 47 අතරින්<br><br>පශ්චාත් උපාධි සිසුන් 7ක් | පර්යේෂණ හා පශ්චාත් උපාධි ප්‍රදාන 19ක් අයදුම්පත් 74 අතරින්<br><br>පශ්චාත් උපාධි සිසුන් 6 ක් | පර්යේෂණ හා පශ්චාත් උපාධි ප්‍රදාන 51ක් අයදුම්පත් 200 අතරින් ප්‍රදානය කරනලදී.<br><br>පශ්චාත් උපාධි සිසුන් 32 ලියාපදිංචි වී හා 48 ලියාපදිංචි වීමට ඇත | | | |
| විද්‍යාත්මක පර්යේෂණ උදෙසා ජනාධිපති සම්මාන | පැවති උත්සව ගණන හා සම්මානලාභී වද්‍යාඥයින් ගණන | පර්යේෂණ සම්මාන ලාභීන්ගේ දත්ත මූල්‍ය ගොඩනැගීම අඛන්ඩව සිදු කිරීම | 2003, 2004, 2005 වර්ෂ සඳහා සම්මාන ප්‍රදානය සිදුකිරීම | 2007, 2008, 2009 සඳහා දත්ත මූල්‍ය ගොඩනැගීම | - | 0 | - |

# පසුගිය වර්ෂ 3ට අදාල මූල්‍ය සුවිශේෂීතාවයන්

පසුගිය වර්ෂ 3 හි මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය තවදුරටත්.....

| වැඩසටහන් / මූලෝපාය | භෞතික ප්‍රගතිය | | | | මූල්‍ය ප්‍රගතිය රු. මිලියන | | |
|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | 2009 | 2010 | 2011 | 2009 | 2010 | 2011 |
| | | | | | | | |
| පර්යේෂණ ආයතන ඇගයීමේ වැඩසටහන , මාධ්‍ය සංවර්ධන හා වෙනත් වැඩසටහන් | සම්පූර්ණ කරන ලද ආයතන | - | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇගයීම හා වාර්ථාව ජනාධිපති ලේකම්තුමා වෙත භාර දීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇගයීම හා වාර්ථාව ජනාධිපතිතුමා වෙත භාර දීම | - | - | - |
| | සම්පූර්ණ කළ ක්‍රියාකාරකම් | දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණය,දසව ස්සැමරුම් ග්‍රන්තය හා සම්මේලනය පැවැත්වීම | දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශණය , විද්‍යාඥයින් දැයට හඳුන්වා දීමේ වැඩසටහන හා මාධ්‍ය පර්යේෂණ තාක්ෂණ වෙබ් අඩවි නිර්මානය සිදුකිරීම | දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශණය | | | |
| එකතුව | | | | | 77.7 | 70.2 | 220.2 |

# ක්‍රියාත්මක වැඩසටහන්

**පශ්චාත් උපාධි සහ පර්යේෂණ ප්‍රධාන වැඩසටහන**

- හැඳින්වීම
- කාලච්ඡේදයේ ප්‍රගතිය
- කාලච්ඡේදයේදී ආරම්භකරන ලද නව ප්‍රදානයන්

# හැඳින්වීම

## පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

ජාතික පර්යේෂණ සභාව විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සපයයි. ප්‍රදානයන් රාජ්‍ය අංශයේ සෑම ආයතනයකම පර්යේෂකයන් සඳහා විවෘත වේ. රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන ආයතන වන්නේ ජාතික පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල, ආශ්‍රිත ආයතන, හා පර්යේෂණ කිරීම සිය විධානයේ සඳහන් අර්ධ රාජ්‍ය ආයතනයන් ය.

වාර්ෂිකව සෑම වසරකම ආරම්භයේ අයදුම්පත්කැඳවනු ලබන පර්යේෂණ ප්‍රදාන සභාව මගින් ඇගයීමට ලක්කරනු ලැබේ.




වැඩසටහන ලෙස පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා තරඟකාරී පර්යේෂණ ප්‍රධානයන් ලබාදෙනු ලබයි. ශ

ඇගයීම් නිර්නායකයන්ට විද්‍යාත්මක අංගයන්, ජාතික සංවර්ධනය උදෙසා දක්වන දායකත්වය, රටේ විද්‍යාත්මක හා තාක්ෂණික ධාරිතාවයන් ශක්තිමත් කිරීමට දක්වන දායකත්වය, සහ අන්තර්ජාතික සඟරාවන්හි පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාෂයට පත්කිරීමේ හැකියාව අයත්වේ.

උසස් ගණයේ මූලික පර්යේෂණයන් ද එමගින් රටේ සංවර්ධනයට ඇති විභවතාවය සළකා බලමින්, ඉතා දැඩි ඇගයීමේ ක්‍රියාවලියක් යටතේ කවුන්සිලය විසින් තෝරාගනු ලබයි.

මෙසේ තෝරාගනු ලබන පර්යේෂණ ව්‍යාපෘතීන් සඳහා කවුන්සිලය විසින් තීරණය කරනු ලබන පරිදි සුදුසු අරමුදල් ප්‍රමාණයන්, මහා භාණ්ඩාගාරය හරහා පර්යේෂණය සිදුකිරීමේ සම්පූර්ණ වගකීම සහිත ව්‍යාපෘතීන් හි ප්‍රධාන පර්යේෂකයන් වෙත ලබාදෙනු ලබයි. උපකරණ, නශ්‍ය ද්‍රව්‍ය යනාදිය සඳහා අරමුදල් ලබාදෙයි.

ව්‍යාපෘතීන් හි සාර්ථකත්වය මැනබලනුයේ තීරක සඟරාවන්හි (විද්‍යාත්මක පර්යේෂණ සුවිකගත සඟරාවන්හි) එනම් අග්‍රගණ්‍යය පර්යේෂකයන් විසින් අගයනු ලබන සඟරාවන්හි ප්‍රකාශනයන් පළකිරීමේ ප්‍රමාණය මතය. මේ මගින් අන්තර්ජාතික මට්ටමේ නිර්නායකවලට අනුකූලව පර්යේෂණ සිදුකිරීම සහතික කරන අතර එවැනි උසස් නිර්නායක ලඟාකරගැනීමට අපගේ පර්යේෂකයන් දිරිගැන්වීම සිදුවෙයි.

අවසාන වශයෙන් පර්යේෂණ ව්‍යාපෘතීන් හි මහජනතාවට සෘජු ප්‍රතිඵල ගෙනදෙන්නේනම් එවැනි ව්‍යාපෘති මහජන දැනුවත්කිරීමේ වැඩසටහන් සඳහා යොමුකරනු ලබයි.

සමාන ක්‍රියාකාරකම් වලින් සමන්විත බැවින් ඉහත වැඩසටහන් ඒකාබද්දව ක්‍රියාත්මක කෙරේ.අයදුම්කරුවන්ගේ හා ඇගයීමේ පහසුව සඳහා මෙවර පැවති අයදුම්පත් ද්විත්වය ඒකාබද්ද කොට නව අයදුම්පත් සකසන ලදී.

**පශ්චාත් උපාධි වැඩසටහන**

රටක විද්‍යා හා තාක්ෂණයේ තත්ත්වය එහි සංවර්ධන මූලෝපායේ කොඳු නාරටිය ලෙස සලකයි. මේ කරුණ නූතන කාර්මීකරණ රටවල් එනම් දකුණු කොරියාව, තායිලන්තය, සිංගප්පූරුව යනාදී රටවල් සීඝ්‍ර සංවර්ධනයක් ලඟාකරගැනීම මගින් වඩාත් නිරූපනය කරයි. මෙම රටවල් දළ දේශීය නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක ප්‍රාග්ධන ආයෝජනයන් වඩාත් පුහුණු විද්‍යාඥයන් (පශ්චාත් උපාධි මට්ටමේ) මූලික විද්‍යාවන්ගෙන් (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය, ජීව විද්‍යාව, වෛද්‍ය විද්‍යාවන්, ඉන්ජිනේරු විද්‍යාවන් සහ කෘෂිකාර්මික විද්‍යාවන් බිහිකිරීම සඳහා සිදුකරයි. ශ්‍රී ලංකාවේ ආයෝජනයන් මෙම රටවල්වලට වඩා පසුගාමී වීමට හේතුව ද එය යි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ “මහින්ද චින්තන - නව ශ්‍රී ලංකාවක් සඳහා දර්ශනයක්” යන සංවර්ධන රාමුවට අනුව සහ 2007 ජාතික

අයවැය මගින් ප්‍රසිද්ධකරන ලද සංවර්ධන දශකය අනුව, ජාතික පර්යේෂණ සභාව වෙත පශ්චාත් උපාධි 500ක් සංවර්ධන දශකය තුල සම්පූර්ණ කිරීම සඳහා වන මූල්‍යනයේ හා ඇගයීමේ කාර්යයභාරය පවරා ඇත.

මෙම වැඩසටහන යටතේ විශ්ව විද්‍යාල, රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන ආයතන (තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය, ජාතික ජලජ සම්පත් සංවිධානය, කාර්මික තාක්ෂණික ආයතනය, වැනි...) ආයතන අතර වන ක්‍රියාකාරී සහභාගිත්වය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය අපේක්ෂා කෙරේ.මෙමගින් ආධුනික විද්‍යාඥයන්ට , රාජ්‍ය ආයතනයන් හි පශ්චාත් උපාධි මට්ටමේ පුහුණුවක් ලබාගැනීමට ක්‍රමවේදයක් සැකසීමට ද අපේක්ෂා කරයි

# කාලච්ඡේදයේ ප්‍රගතිය

## 2011 පලමු කාර්තුව

**පර්යේෂණ ප්‍රදාන වැඩසටහන හා** පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් සමාන ක්‍රියාකාරකම්වලින් යුතු නිසා ඒකාබද්ධව ක්‍රියාත්මක වේ. අයදුම්කරුවන්ට මෙන්ම මෙහෙයුම් ඇගයීම් කටයුතු සඳහා ද පහසු වන පරිදි එක් සරල විස්තරාත්මක අයදුම්පතක් මේ සඳහා සකසන ලදී.

අයදුම්පත් කැඳවීම - පුවත්පත් දැන්වීමක් මගින් සිදුකරන අතර දැන්වීම සියලුම විශ්වවිද්‍යාල, රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන හා අදාල අනෙකුත් ආයතන අතර බෙදාහරින අතර ජාතික පර්යේෂණ සභා පර්යේෂක දත්ත මූලයේ සියලුම පර්යේෂකයන්ට විද්‍යුත් තැපැල මගින් දන්වන අතර ජා. ප. ස. වෙබ් අඩවියේ ද ප්‍රදර්ශනය කරන ලදී.

බහුවිෂයයික ප්‍රවේශයන් සහිත කණ්ඩායම් පර්යේෂණ, සහයෝගිත්ව පර්යේෂණ හා ආරම්භක තත්වයේ පර්යේෂණ දිරිගන්වනු ලැබේ. අදාල කාලය තුල ලද සෑම ඉල්ලීමක්ම නිසි අවධානයට ලක්කරන ලදී.

අයදුම් පත් කැඳවීම 2011 මාර්තු මස අවසන් කරන ලදී අයදුම්පත් 199 ලද අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව තුන් ගුණයක වැඩිවීමකි.

දැනට ක්‍රියාත්මක පර්යේෂණයන් හි මිලදීගැනීම් දිගටම සිදුවූ අතර වාර්ෂික ප්‍රගති වාර්තා ඇගයීම් සඳහා යොමුකරන ලදී.

**2011 අයදුම්පත් - සුවිශේෂිතා**

| | |
|---|---|
| ලද අයදුම්පත් ගණන | **199** |
| පශ්චාත් හා දර්ශනවේදී සිසුන් | **270** |
| කණ්ඩායම් පර්යේෂණ වැඩසටහන් | **135** |
| උප පර්යේෂකයන්/සහයොගිකයන් | **254** |
| විදෙස් සහයෝගිතා | **12** |

සභාපති කාලය තුල ජාපස පර්යේෂකයන් ගණනාවක් හමුවී පර්යේෂණ ව්‍යාපෘතීන් හි ප්‍රගතිය සාකච්ඡා කරනලදි.

වැදගත් පර්යේෂණ මාතෘකා

| වෛද්‍ය | කෘෂිකාර්මික | බලශක්ති/ඉන්ජිනේරු | පාරිසරික/වන සම්පත් | පරිගණක |
|---|---|---|---|---|
| **ඩෙංගු** | අල බීජ | සුලං බලය | නකල්ස් | භාෂා අක්ෂර පරිවර්තනය |
| පියයුරු පිළිකා | පිටි මකුණා | සූර්ය බලය | බීජ ජීව විද්‍යාව | නාවික සමාකරණය |
| ලෙයිෂ්මානියා | සහල් අභිජනනය | ව්‍යුහගත ඉංජිනේරු විද්‍යාව | සණ අපද්‍රව්‍ය | පොලිස් අපරාධ පුරෝකතනය |
| අස්ථි බද්ධය | සහල් සඳහා පොහොර | | අකුණු | ටෙලි මෙඩිසින් |
| වකුගඩු රෝගය | **රබර්** | | මීතේන් විමෝචනය | |
| | **තේ** | | ජීවවායුකරණය | |

පර්යේෂකයන් පර්යේෂණාගාර නිරීක්ෂණ චාරිකා :

සභාපති හා ලේකම් විසින් ජාලස ප්‍රදාන දුන් මූලික අධ්‍යයන ආයතනය, මහනුවර හා පේරාදෙනිය විශ්ව විද්‍යාලය තුල ඇති පර්යේෂණාගාර ගණනාවක් නිරීක්ෂණය කරන ලදී.

*ලිෂ්මානියා වැඩසටහන* :

සභාපති විසින් ලිෂ්මානියා පිළිබඳව පර්යේෂණ සිදුකරන ජාපස ප්‍රදානලාභී පර්යේෂකයන් දෙදෙනකු මුණගැසුනු අතර එක් පර්යේෂණ තේමාවක් යටතේ පර්යේෂණ සිදුකරන පර්යේෂකයන් එකට ගොනුකිරීමේ අරමුණින් මෙය සිදුකරන ලදී. ඔවුන් ලිෂ්මානියා රෝගය බහුල ප්‍රදේශයන් හි මහජනතාව දැනුවත්කිරීමේ වැඩසටහන් සිදුකිරීමට එකඟතාව පළකරන ලදී.

**2011** දෙවන කාර්තුව

2011 වසර තුල ලද අයදුම්පත් එකිනෙකා නොහඳුනන ක්ෂේත්‍රෙය් ප්‍රවීන ඇගයීම්කරුවන් දෙදෙනකුට යොමුකරන ලදුව ජූනි මස 17 හා 18 දින පැවති සභා රැස්වීමේ දී තවදුරටත් අයදුම්පත් ඇගයීමට ලක්කරන ලද අතර ඉහල විද්‍යාත්මක කුසලතාවක් හා ජාතික වැදගත්කමකින් යුතු අයදුම්පත් ප්‍රදාන සඳහා තෝරාගන්නා ලදී.

මූල්‍යනය සඳහා තෝරාගත් අයදුම්පත් ගණන = 79

නැවත ඉදිරිපත්කිරීමට යොමුකරන ලද අයදුම්පත් ගණන = 55

ප්‍රතික්ෂේපිත අයදුම්පත් ගණන = 64

නැවත ලබාගත් අයදුම්පත් ගණන = 1

අයදුම්පත් අතරින් 39% ක් පමණක් තේරී ඇත. තෝරාගත් අයදුම්පත් මූල්‍යනය සඳහා මහා භාණ්ඩාගාරයට යොමුකරන ලදී.

**2011** තුන්වන කාර්තුව

මහා භාණ්ඩාගාරය රු මිලියන 155 නිදහස් කරන ලද අතර ප්‍රදානයන් 43 ලබාදෙන ලදී.

නෛතික හා බැංකු ලේඛන සකසන ලදි. පසුව ප්‍රදාන ගිණුම් ආරම්භ කරන ලදී. නෛතික ලේඛන අත්සන් කරන අවස්ථාවේ දී සෑම ප්‍රදානලාභියෙක්ම සභාපතිවරයා හමුවිය. සෑම ප්‍රදානලාභියෙක්ටම ජාපස ප්‍රදාන ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ හැඳින්වීමක් ලබාදෙන ලදී.

**2011** සිව්වන කාර්තුව

ඉතිරි රු මිලියන 20 නිදහස් කරන ලද අතර ප්‍රදානයන් 8 ලබාදෙන ලදී.

කාලච්ඡේදය තුල පශ්චාත්/ දර්ශනවේදී සිසුන් 53ක් ලියාපදිංචි විය.

## ප්‍රමුඛතා මූලික සහය වැඩසටහන

**2011** පලමු කාර්තුව

ක්ෂේත්‍රයන් තෝරාගැනීම : තවදුරටත් පර්යේෂණ හා සංවර්ධනයන් අවශ්‍ය පර්යේෂණයන් සමාජයට ප්‍රතිඵලදායි පර්යේෂණ ගණනාවක් පවතී. 2011 අයදුම්පත් කැඳවීමේ දි ඔවුන් අයදුම්පත් ගණනාවක් ඉදිරිපත්කරන ලදී.

**2011** දෙවන කාර්තුව

ආජන්ම මන්දතයිරොයිඩතා හඳුනාගැනීමේ නවජ ලදරු පරීක්ෂාව රු මිලියන. 3.1) සහ පාලම් වල ව්‍යුහයන්හි ඉදිරි කාල නීර්ණය කිරිම( රු මිලියන. 10.5) සඳහා නව ව්‍යාපෘති 2ක් තෝරාගන්නා ලදී.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් චක්‍රලේඛයක් මගින් දකුණු පලාතේ සැම රාජ්‍ය සෞඛ්‍ය ආයතනයකම මෙම ආජන්ම මන්ද තයිරොයිඩතාවය ලේ බිංදු පරීක්ෂාව මගින් හඳුනාගැනිම ආරම්භ කල යුතු බව දැනුම් දී ඇත. මෙම වැඩසටහන ජාපස සා න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය ඒකබද්ධව සිදුකරන්නකි.

බුත්තල පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව ආජන්ම මන්දතයිරොයිඩතා හඳුනාගැනීමේ නවජ ලදරු පරීක්ෂාව මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම **සඳහා** මූලික සාකච්ඡාවන් පැවැත්විය.

ජාපස ප්‍රදාන 11- 160
"ශ්‍රී ලංකාවේ මව්වරුන්ගේ නවජ ලදරු හැසිරීමේ මානයන් තක්සේරුකිරීමට හා ආජන්ම මන්දතයිරොයිඩතාව සඳහා නවජ ලදරු පරීක්ෂා ඒකකයක් පිහිටුවීම "

ආචාර්ය මංජුල දේශප්‍රිය හෙට්ටි ආරච්චි
න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය, වෛද්‍ය පීඨය,
රුහුණ විශ්ව විද්‍යාලය, , තැ.පෙ. 70, කරාපිටිය, ගාල්ල

ජාපස ප්‍රදාන 11- 106
"ශ්‍රී ලංකාවේ පවතින පාලම් වල පාරිසරික අන්තර්ක්‍රියාවන් හා අධික බර හේතුවෙන් වන හානි හඳුනාගැනීම. තක්සේරුකිරීම, කාල නිර්නය හා අලුත්වැඩියාව"

මහාචාර්ය පී.බී.ආර්.දිසානායක මහතා
සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය

සබරගමු පලාතේ ඇති ඉදිකිරිම් සඳහා යකඩ බහුලව භාවිතා කර ඇති ප්‍රධාන පාලම් හය (06)ක ඉදිරි කාල නීර්ණය කිරිමේ කටයුතු කිරිමට තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය හරහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට කටයුතු කෙරිණි

<u>තුන්වන හා සිව්වන කාර්තුව</u>

ඉහත පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් යොදවන ලදී.

## සංවර්ධන හා තාක්ෂණ පැවරුම් වැඩසටහන

පළමු - සිව්වන කාර්තුව—අරමුදල් නිදහස් නොකෙරුණි.
මහාචාර්ය සී ඒ එන් ප්‍රනාන්දු මහතා පර්යේෂණ ප්‍රදාන 05-29 යටතේ නැනෝ තාක්ෂණ විද්‍යාගාරයක් වයඹ විශ්ව විද්‍යාලයේ ආරම්භ කර ඇත. මෙම විද්‍යාගාරය පර්යේෂණ ක්‍රියාකාරකම් වලට අමතරව උපාධි හා පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගේ නැනෝ තාක්ෂණය ක්ෂේත්‍රයේ දැනුම වර්ධනය සඳහා ද පහසුකම් සපයයි.

බුද්ධිමය දේපල ප්‍රතිපත්තියක් ගොඩනැගීම – මනීෂා රාජපක්ෂ මහත්මිය හා සමන්ත ගම්හේවා මහතා වර්ධනය හා සෞභාග්‍යය සඳහා බුද්ධිමය දේපල යන මාතෘකාව යටතේ කාර්මික තාක්ෂණ ආයතනය හා අන්තර්ජාතික සංවර්ධන නීති ආයතනය මගින් සංවිධානය කල වැඩමුළුවකට සහභාගිවිය.

බීටීකේ සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීම – මෙය ජාපස ප්‍රදාන 05-10 ආචාර්ය රාධිකා සමරසේකරට අදාලය.
ජාපස බීටීඅයි සඳහා ලියාපදිංචිය ලබාගැනීමට ද සහය ලබාදුනි. පළමු ශ්‍රී ලාංකීය ජෛව පළිබෝධනාෂකය වන බැවින් එය ලබාගැනීමේ දී විවිධ බාධක මතුවී තිබුණි. මේ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ සහයෝගය ද ලබාගන්නා ලදී.

ඩෙංගු පරීක්ෂණ පද්ධතියක් හඳුන්වාදීම - තාක්ෂණික ගැටළු හේතුවෙන් මෙම පද්ධතිය අපේක්ෂාකල පරිදි ඉටු නොවීය.

## කාලච්ඡේදයේදී ආරම්භකරන ලද නව ප්‍රදානයන්

| ප්‍රදාන අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රධාන පර්යේෂක | ආයතනය |
|---|---|---|---|
| 11-004 | An investigation of the lightning environment in Sri Lanka | Prof. D. U. J. Sonnadara | University of Colombo |
| 11-007 | Space-Time dynamics and parameters of growth of toxic cyanobacteria in Nuwara wewa and Nachchaduwa wewa in Anuradhapura. | Prof. A. Weerasinghe | Rajarata University of Sri Lanka (RUSL) |
| 11-011 | Genotoxicity assessment of surface waters of Kelani River and the industrial effluents reaching the river using different biological systems | Prof. A. Pathiratne | University of Kelaniya |
| 11-015 | Novel cardiovascular risk markers Paraoxonase ,Apolipoprotien A-1 (apoA- 1) and Glutathione Peroxidase genotype -1 in Coronary Artery Disease | Prof. H. Peiris | University of Sri Jayewardenepura |
| 11-022 | Investigations on endophytic diazotrophic bacteria and their inoculation effects on growth and nitrogen uptake of rice | Dr. N. Welikala | University of Kelaniya |
| 11-023 | Metabolite Profiling of Tea Germplasm of Sri Lanka | Dr. P. A. N. Punyasiri | Tea Research Institute of Sri Lanka (TRI) |
| 11-025 | Social Sensor Networks for Opinion Analysis | Dr. T. N. K. De Zoysa | University Of Colombo School of Computing |
| 11-029 | Data-driven Speech Translation between Sinhala and Tamil | Dr. A. R. Weerasinghe | University of Colombo School of Computing |
| 11-034 | Molecular detection of toxigenic cyanobacteria, quantification of microcystin and exploiting microbial diversity to remove microcystin for water treatment solutions | Dr. M. M. Pathmalal | University of Sri Jayewardenepura |
| 11-042 | Determination of the Genetic Architecture of Yellow (Dwarf) Coconut Populations in Sri Lanka | Dr. S. A. C. N. Perera | Coconut Research Institute |
| 11-046 | one graft and bone substitutes for treating bone injuries, traumas, non-traumatic disorders. | Prof. R. P. V. J. Rajapakse | University of Peradeniya |

| ප්‍රදාන අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රධාන පර්යේෂක | ආයතනය |
|---|---|---|---|
| 11-051 | A study on the prevalence and clinico-pathological characterization of triple negative breast carcinomas and those with basal phenotype. | Prof. M. D. S. Lokuhetty | University of Colombo |
| 11-053 | Synthesis, characterization and study of physico-chemical properties of some polymeric materials in the form of nanofibres and their applications in antimicrobial polymer nanofibre water filters and dye-sensitized solar cells. | Prof. C. B. DISSANAYAKE | Institute of Fundamental Studies |
| 11-054 | Development of electrochemical technologies to remove organic and heavy metal pollutants present in pesticides | Dr. K. G. N. Nanayakkara | Institute of Fundamental Studies |
| 11-056 | Application of Biofilm-Biotechnology for biofuel production, novel biofertilizer development and amelioration of environmental pollution | Prof. G. Seneviratne | Institute of Fundamental Studies |
| 11-059 | Gene expression analysis: Identifying the missing link in chronic kidney disease of unknown aetiology (CKDu) in Sri Lanka | Dr. D. N. Magana-Arachchi | Institute of Fundamental Studies |
| 11-065 | Vidusayura - A perception enhanced immersive virtual environment for maritime education. This is a tailor-made Virtual Reality (VR) solution for Sri Lanka Navy(SLN) | Prof. N. D. Kodikara | University of Colombo School of Computing (UCSC) |
| 11-066 | Accuracy, Convenience and Benefits of treating Patients in an eClinic using the Vidusuwa Telemedicine Solution in a Sri Lankan Context | Dr. S. M. K. D. Arunatileka | University of Colombo School of Computing (UCSC) |
| 11-067 | Development of Assistive Robotic Arms | Dr. R. A. R. C. Gopura | University of Moratuwa |
| 11-071 | Intelligence Led Policing Using Data Mining Techniques | Dr. Y. P. R. D. Yapa | University of Peradeniya |
| 11-072 | Towards Better Performance: Development of an Automated Tool for Performance Evaluation in Sports using Trajectory Analysis. | Dr. U. A. J. Pinidiyaarachchi | University of Peradeniya |
| 11-075 | Viral aetiologies of encephalitis in a hospital-based patient population in Sri Lanka | Dr. T. Chang | University of Colombo |
| 11-080 | A. Investigation of gastrointestinal parasitic infection in goats in North Western Province and implementation of genetic and immunological intervention | Mr. P. A. Gamika | Wayamba University of Sri Lanka |
| 11-087 | Identification of genomic regions associated with phosphate deficiency tolerance in Sri Lankan rice germplasm for marker assisted breeding | Dr. S. D. S. S. Sooriyapathirana | University of Peradeniya |
| 11-091 | Dormancy and germination requirements of seeds of some dominant mountain forest species in Sri Lanka, and possible effects of climatic change | Dr. K. M. G. G. Jayasuriya | University of Peradeniya |

| ප්‍රදාන අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රධාන පර්යේෂක | ආයතනය |
|---|---|---|---|
| 11-093 | The psychological impact of spinal cord injury; Long term difficulties and coping strategies | Dr. S. Williams | University of Kelaniya |
| 11-099 | Molecular identification of Ralstonia solanacearum (E.F.Smith) in seed potato. | Dr. P. N. Dasanayaka | University of Sri Jayewar-denepura |
| 11-106 | Assessment, damage detection, life evaluation, repair and retrofitting of existing bridges in Sri Lanka due to over-loading and environmental interaction | Prof. P. B. R. Dissanayake | University of Peradeniya |
| 11-116 | Selection and evaluation of potential egg parasitoids for biocontrol of Cnaphalocrocis medinalis, Rice leaf folder. | Dr. K. S. Hemachandra | University of Peradeniya |
| 11-118 | Effect of soil amendment with silicon on preharvest fungal disease and postharvest quality of bitter gourd | Dr. W. A. M. Daundase-kera | University of Peradeniya |
| 11-120 | Establishment of native tree islands in man-made grass-lands at the Knuckles Forest Reserve, Sri Lanka. | Dr. A. M. T. A. Gunaratne | University of Peradeniya |
| 11-121 | Effectiveness of multi strain Rhizobial inoculants for edible legumes of Sri Lanka | Dr. C. L. Abayasekara | University of Peradeniya |
| 11-122 | Characterization of the antibacterial activity of Triphala, a commonly used Ayurvedic product, against multi-resistant human pathogens | Prof. V. Thevanesam | University of Peradeniya |
| 11-125 | Empowering rubber farmers in non-traditional rubber growing areas through knowledge on combating adverse impacts of environment for better productivity | Dr. L. Samarappuli | Rubber Research Institute of Sri Lanka |
| 11-129 | Dengue virus dynamics/genetic changes in the vector mosquitoes and geo-climatic factors that predict clinical severity of dengue fever (DF), dengue haemorrhagic fever (DHF) and DF/DHF outbreaks | Dr. F. Noordeen | University of Peradeniya |
| 11-142 | Assessment of heavy metal pollution in sediments and surface soils in the Colombo Metropolitan Region | Dr. H. M. T. G. A. Pi-tawala | University of Peradeniya |
| 11-148 | Methane (CH4) and nitrous oxide (N2O) emission from six rice varieties as governed by soil microbial communities, rhizosphere characteristics and agronomic practices | Prof. R. M. C. P. Rajapak-sha | University of Peradeniya |
| 11-152 | A Study on Design of Domestic Type Machine for De-polymerizing Solid Waste of Polythene and Plastic Bottle to Usable Hydrocarbon Fuel. | Dr. N. K. Hettiarachchi | University of Ruhuna |
| 11-157 | Development of Breakthrough Technologies Relevant to Polymer Composites | Dr. L. A. Panamgama | University of Ruhuna |

| ප්‍රදාන අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රධාන පර්යේෂක | ආයතනය |
|---|---|---|---|
| 11-158 | Anaerobic Co-digestion of Rice Straw and Organic Fraction of Municipal Solid Waste for the Enhancement of Biogasification through Physicochemical Adjustments | Mr. S Wijetunga | University of Ruhuna |
| 11-160 | Establishment of national neonatal screening center for congenital hypothyroidism and to assess the predictors of newborn screening behavior of Sri Lankan mothers | Dr. M. D. Hettiarachchi | University of Ruhuna |
| 11-166 | Investigation of background concentrations and spatial distribution of Heavy metals in surface soils and crops in agricultural fields in Sri Lanka | Prof. S. P. Indraratne | University of Peradeniya |
| 11-175 | Improving the performance of hybrid nanocrystalline titanium dioxide (TiO2) / polymer solar cell using interface modifiers | Prof. P. Ravirajan | University of Jaffna |
| 11-176 | Establishment of Indian sandalwood (Santalum album) plantations and determination of the variation of oil contents in different geographical regions of Sri Lanka | Dr. S. M. C. U. P. Subasinghe | University of Sri Jayewardenepura |
| 11-178 | synthesis of value added products from Sri Lankan dolomitic marbles | Dr. D. G. G. P. Karunaratne | University of Peradeniya |
| 11-179 | Investigation of phosphorus and potassium nutrition of lowland rice crops in Sri Lanka to increase their nutrient use-efficiency. | Dr. L. D. B. Suriyagoda | University of Peradeniya |
| 11-180 | Petrogenesis and geochronology of ultra high temperature granulites from the Highland Complex of Sri Lanka | Dr. M. A. S. P. K. Malaviarachchi | University of Peradeniya |
| 11-192 | Bionomics of mealybug species of the low country dry zone, Sri Lanka and their potential threats to the agriculture. | Dr. M. Vinobaba | Eastern University |
| 11-193 | Retrofitting of Existing Masonry Building for Dynamic Load induced by Natural Hazards | Dr. G. S. Y. De Silva | University of Ruhuna |
| 11-195 | Studies on possibilities of Biofuel production through selected Algae species available in Sri Lanka | Prof. S. Subasinghe | University of Ruhuna |
| 11-196 | Fabrication of efficient low cost photo-electrochemical solar cells using novel gel/solid polymer electrolytes and modifying the photo-electrode | Dr. T. M. W. J. Bandara | Rajarata University of Sri Lanka |

# ක්‍රියාත්මක වැඩසටහන්

## විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන

- හැඳින්වීම
- කාලච්ඡේදයේ ප්‍රගතිය

# හැඳින්වීම

විද්‍යාත්මක පර්යේෂණ උදෙසා ජනාධිපති සම්මාන වැඩසටහන 2001 වසරේ දී ශ්‍රී ලංකාවේ පර්යේෂකයන්ට අන්තර්ජාතික මට්ටමේ තත්ත්වයක් ලබාකරගැනීමටත් ජාතික විද්‍යාත්මක නිෂ්පාදයන්හි වර්ධනයක් ඇතිකිරීම උදෙසාත් ආරම්භ කර ඇත.

සම්පූර්ණ කාර්යයක්‍රමයම විද්‍යාත්මක පර්යේෂණ සූචිකය මත පදනම්වේ. විද්‍යාත්මක පර්යේෂණ සූචිකය පර්යේෂණ ශික්ෂාවන් 100 කට අදාලව ලෝකයේ ප්‍රමුඛ විද්‍යාත්මක හා තාක්ෂණික සඟරාවන් 3700කට අධික ප්‍රමාණයක් ආවරණය වන වැදගත් දත්ත සූචිකයකි. විද්‍යාත්මක පර්යේෂණ සූචිකයට ඇතුලත් වන සෑම සඟරාවක් ම ඉතා ඉහල තත්ත්වයකට අයත්වන අරමුණුගත ඇගයීම් ක්‍රමවේදයකින් අතිරේක හා නොවැදගත් සඟරාවන් ඉවත්කරනු ලැබූ සහ නිවැරදි, අර්ථවත්, හා කාලීන තොරතුරු සහිත සඟරාවන් ලෙස තෝරාගනු ලැබූ ඒවා වේ.

විද්‍යාත්මක පර්යේෂණ උදෙසා ජනාධිපති සම්මාන වැඩසටහන විද්‍යාත්මක පර්යේෂණ සූචිකයහි එක ශ්‍රී ලාංකික ලිපිනයක් හෝ සහිත විද්‍යාත්මක මාතෘකාවන් ( සමාජ විද්‍යාවන් හැරුණුකොට) ඇති පර්යේෂකයන් ආවරණය කරනු ලැබේ.

2007,2008,2009 වර්ෂ සඳහා විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන වැඩසටහෙනි මූලික කටයුතු නිම කරන ලදී.වර්ෂ 3 සඳහා ක්‍රියා 573 අතරින් විද්‍යාඥයින් 745 හඳුනාගන්නා ලදී. පුද්ගල සමුච්චිත දර්ශකය විද්‍යාඥයින් සඳහ , ආයතන සඳහා වන සමුච්චිත දර්ශකය කණනය කිරීම සම්පූර්ණ කරන ලදී.වසර 3 සඳහා නිර්දේශක ග්‍රන්ථය සැකසීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී.

# කාලච්ඡේදයේ ප්‍රගතිය 2011

## පලමු කාර්තුව 2011

විද්‍යාත්මක පර්යේෂණ උදෙසා ජනාධිපති සම්මාන වැඩසටහන මුළුමනින්ම විද්‍යාත්මක පර්යේෂණ සුචිකය මත පදනම්වේ  විද්‍යා නාමකරන දර්ශකයෙහි ප්‍රකාශකයා ලෝකයේ විද්‍යාත්මක පර්යේෂණ වාර සඟරා වල ගුණත්වය හා විද්‍යාවට දක්වන බලපෑම පදනම් කරගනිමින් අගයකිරීමට ලක්කරයි. නාමකරන දර්ශකයට පර්යේෂණ වාර සඟරා 3800 පමණ අයත්වන අතර ඊට වසරකට පර්යේෂණ පත්‍රිකා නාම 1,200,000 පමණ ඇතුලත්වේ.

ශ්‍රී ලංකාවේදී විද්‍යා නාම කරණ දර්ශකය ගවේෂනය කළ හැක්කේ වි.නා.ද. මිලදී ගැනීමෙන් හෝ  අන්තර්ජාල  දත්ත පද්ධතිය මිලදීගැනීමෙනි.ලංකාවේ වි.නා.ද. මිලදී ගත හැක්කේ ජාතික පුස්තකාලයෙනි. එයද ගවේශනය සඳහා පමණක් වන අතර රැගෙන යාමට ලබා නොදෙයි. හේතුව මෙම වි.නා.ද. සඳහා ඉහල වටිනාකමක් යටතේ මිලදී ගන්නා බැවින් හා  ප්‍රකාශන හිමිකම පිළිබඳ ගැටලු ඇති බැවිනි.

2007,2008,2009 වර්ෂයන්හි ප්‍රකාශන සංඛ්‍යාව පිළිවෙලින් 274, 318 සහ 300ක් වේ.
සහාව 2007, 2008 හා 2009 වසර සඳහා පහත වගුවේ දැක්වෙන මූලාදර්ශය අනුමතකර ඇත.

විද්‍යා නාම කරණ දර්ශකය  තුල අඩංගු සඟරාවන්හි පලවන ප්‍රකාශනයන් ගෙන් ශ්‍රී ලාංකීය ලිපිනයක් සහිතව (සම්පූර්ණයෙන් හෝ කොටසක් ) පමණක් සම්මාන සඳහා සලකා බැලේ.

## දෙවන කාර්තුව 2011

දත්ත මූලය සැකසෙමින් පවතී. පහත පියවරටයන් අනුගමනය කල යුතුය.

නාමයෝජනා සඳහා ප්‍රකාශන තෝරාගැනීම

විනාද ලිපිනයන් එක ප්‍රකාශනයක ශ්‍රී ලාංකික ලිපිනයක් සහිතව කතුවරයෙක් දැකවෙන සියලුම දෘඩ විද්‍යා නාමයන් (සමාජ විද්‍යාවන් අතහැර) ආවරණය වන පරිදි පර්යේෂණ සම්මාන වැඩසටහන සම්පිණ්ඩනය කර ඇත. නොවැදගත් සේ හඳුනාගත් ප්‍රකාශන උදා. රැස්වීම් විවේචන, ලිපි හා පිළිතුරු, පැහැදිලි ලෙසම පර්යේෂණ නොවන ප්‍රකාශන, හා වෙනත් තොරතුරු ආදිය.. ඉවත්කර පර්යේෂණ පත්‍රිකාවන්ට පමණක්  සීමාකර ඇත.

මූලික වශයෙන් විනාද දත්ත මූලය ශ්‍රී ලාංකික ලිපිනයක් ලිපිනයන් තීරයේ පලකරඇති ප්‍රකාශන වෙන්කරගැනීමට පරික්ෂා කරන ලදී  එසේ පරීක්ෂා කල දත්තයන් පර්යේෂණ ප්‍රදාන සඳහා ප්‍රකාශන වල දත්ත මූලය ගොඩනැගීමට යොදාගනී. .

පත්‍රිකාවේ නම
කතෘ නාමය
ලිපිනය
සම්පූර්ණ ග්‍රන්ථ නාමය
කෙටි ග්‍රන්ථ නාමය

දත්ත මූලා තුලින් තොරතුරු ලබාගනු ලැබේ.

කතෘ වරුන්ගේ නම්
ක
සම්පූර්ණ මූලාශ්‍රය

| වර්තමාන වගන්තිය | යෝජිත වගන්තිය | තීරණය |
|---|---|---|
| ශ්‍රී ලංකා ආයතනයක ලිපිනයක් පමණක් වි.නා.දර්ශකයේ යම් වර්ෂයකට අදාලව දැක්වේ නම් දර්ශකාංශ 2ක් සෑම ප්‍රකාශයනයක් සඳහාම ලබාදෙනු ලැබේ | එම වගන්තියම යොදා ගැනේ. | √ |
| විදේශ ආයතනයක් ලිපිනයක් ද එහි සඳහන් වේ නම් දර්ශකාංක 1.0 ලබා දෙයි | විදේශ ආයතනයක් ලිපිනයක් ද එහි සඳහන් වේ නම් දර්ශකාංක 1.5 ලබා දීමට 2008 ජනවාරි 11 පැවති 17වන සභා රැස්වීමේ දී තීරණය විය. **මෙය 2007 වසරෙ සම්මාන වල සිට ක්‍රියාත්මක වේ.** | √ |
| නොවැදගත් හා පර්යේෂණ නොවන ප්‍රකාශනයන් ඉවත්කරනු ලැබේ. | **පර්යේෂණ පත්‍රිකා පමණක් සලකා බැලේ**<br><br>**ලිපි/ ඇගයීම්/ රැස්වීම් සාරාංශ ආදිය ඉවත්කෙරේ.**<br><br>**(2003 හා 2006 සම්මාන සඳහා එවැනි පර්යේෂණ පත්‍රිකා 12 තිබිණි)** | **පර්යේෂණ නොවන ප්‍රකාශන ඉවත්කරනු ලැබේ.** |
| සෑම ප්‍රකාශයනයකටම අදාල කතුවරුන් සඳහා සමානව දර්ශකාංක ලබාදීම මගින් පුද්ගල දර්ශකය ගණනය කරයි. | එම වගන්තියම යොදා ගැනේ. | √ |
| දේශීය / විදේශීය ආයතන වලට අදාල විදේශ කතුවරුන් සම්මාන සඳහා සුදුසුකම් නොලබයි. | එම වගන්තියම යොදා ගැනේ. | √ |
| ප්‍රදාන ලබාගැනීමට හිමිකම් ලැබීමට ඔහු/ ඇය පසුව එන වසරේ දෙසැම්බර් අග දක්වා සිය ක්‍රියාකාරකම් ලංකාව තුල සිදුකල යුතුය.<br><br>මෙම වගන්තිය පර්යේෂකයන් ශ්‍රී ලංකාවේ රඳවාගැනීම සඳහා පනවා ඇත.<br><br>(ශ්‍රී ලංකාවේ ආයතනයකින් ප්‍රකාශයට පත්කළ) | විද්‍යාඥයින්ගේ සංචලතාව මත සමහර කතෘත්වයන් හි අවිනිෂ්චිතතා ඇතිවේ. **පශ්චාත් උපාධි අධ්‍යයන, රැකියා, සප්තවාර්ෂික නිවාඩු, විගමනය, ද්විත්ව පුරවැසිභාවය ආදී...**<br><br>**Sසමහර ඉවත්කල පර්යේෂකයන් පසුව ශ්‍රී ලංකාවට පැමිණ රාජ්‍ය සේවයේ යෙදීමේ දී නැවත සහතික පත් සඳහා විමසුම් කරයි.**<br><br>**වර්තමාන වගන්තිය ඉවත්කෙරේ.** | × |
| විදේශ ලිපිනයකට අදාලව වන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රකාශන (ශ්‍රී ලාංකික පුරවැසියකු විමට හෝ නොවිමට හැක) ඉවත්කරනු ලැබේ. | **වර්තමානයේ රජය විදේශගතව ජීවත්වන ශ්‍රී ලාංකිකයන් හඳුනාගැනීම මගින්, අන්තර්ජාල සහයොගී පර්යේෂණ දිරිගැන්විය යුතුය**<br><br>**ශ්‍රී ලාංකිකයන් විදේශ රටක ආයතනයකට අනුබද්ධව ප්‍රකාශනයන් සිදුකරන විට සම්මාන සඳහා සළකාබලයි.** (ශ්‍රී ලාංකික පුරවැසියකු විමට හෝ නොවිමට හැක) | × |

භාෂාව
ලේඛන වර්ගය

පොත් අංකය
ආශ්‍රිත වාර්තා ගණන
යොමු සඳහන් ගණන

<u>විනාද යෙන් උදාහරණ</u>

"Record 1 of 241

**Authors:** Shibayama-T Ashton-MS Singhakumara-B Griscom-HP Ediriweera-S Griscom-BW
**Title:** EFFECTS OF FIRE ON THE RECRUITMENT OF RAIN-FOREST VEGETATION BENEATH PINUS-CARIBAEA PLANTATIONS, SRI-LANKA
**Abbrev. source:** FOREST ECOL MANAGE 2007, Vol 226, Iss 1-3, pp 357-363
**Document type:** Article
**No. cited references:** 24
**Addresses**: YALE-UNIV, SCH FORESTRY & ENVIRONM STUDIES, NEW-HAVEN, CT 06511, USA
UNIV-SRI-JAYEWARDENEPURA, DEPT FORESTRY & ENVIRONM SCI, NUGEGODA, SRI-LANKA "

ශ්‍රී ලාංකීය ලිපිනයන් සහිත සෑම ප්‍රකාශනයක්ම සම්මාන සඳහා හඳුනා නොගන්නා බැවින් සැබෑ පර්යේෂණ පත්‍රිකා හඳුනාගැනීම සඳහා දත්ත පරීක්ෂාකරනු ලැබේ. එබැවින් නම්කල අයගේ ලැයිස්තුව තීරකයන් ලෙස හඳුනාගත් සභාව/ සභා සාමාජිකයින් වෙත ඉදිරිපත්කර පර්යේෂණ පත්‍රිකා ඒවායේ සැබෑ පර්යේෂණ ස්වභාවය අනුව තීරණය කරයි. නොවැදගත් සේ තීරණය කරන ප්‍රකාශනයන් හැර ඉතිරි ප්‍රකාශනයන් සම්මාන සඳහා හඳුනාගැනේ. තීරකයන්ගේ තීරණය අවසාන තීරණයයි.

<u>තුන්වන කාර්තුව</u>

<u>කතුවරුන් හඳුනැගැනීම</u>

විනාද මගින් කතුවරුන් හා ලිපිනයන් වෙනමම ආකාරයකට ලබාදෙන බැවින්,කතුවරුන්ගේ නම් හා ලිපිනයන් කතුවරුන්ගේ අනන්‍යතාව තහවුරුවට යොදාගැනීමට නොහැකිය. මේ සඳහා කතෘ අනන්‍යතාව තහවුරුකිරීමේ වෙනමම ක්‍රියාවලියක් අවශ්‍ය වේ.

ප්‍රකාශන තොරාගැනීමෙන් පසුව සහරාවන් හි සම්පූර්ණ ප්‍රකාශනය රැස්කල යුතුය. මෙය කතුවරුන්ගේ අනන්‍යතාව තහවුරුව සඳහා ආරක්ෂිත ම ක්‍රමයයි. සම්පූර්ණ ප්‍රකාශනය මාර්ගගතව හෝ මුද්‍රිතව පරිශීලනයෙන් පමණක් නිවැරදි අනන්‍යතාව හඳුනාගත හැකිය.

සඟරා කිහිපයක සම්පූර්ණ ප්‍රකාශනයම පරිශීලනය කල හැකි අතර සමහර ප්‍රකාශනයන් ශ්‍රී ලාංකීය ප්‍රකාශනයන් හරහා ලබාගතහැකිය. සමහර ප්‍රකාශන කතෘවරුන්ගෙන් ඊමේල් මගින් ලබාගත හැකිය. ඉතිර ප්‍රකාශන මිල දී හෝ ඉල්ලාගත යුතුය. ඉහත සියළු ක්‍රම භාවිතාකර කතුවරුන්ගේ නිවැරදි අනන්‍යතාව හඳුනාගතයුතුය.

කතෘවරුන් හඳුනාගැනීම 100%ක්ම නිවැරදි විය යුතුය.

සම්මාන ලාභින් ලැයිස්තුගත කිරීමේ දී හඳුනැගැනිමේ නිර්නායකයන් තදින්ම අනුගමනය කල යුතුය

සමාන නම්, මුලකුරු සහිත කතුවරුන්, එකම කතුවරයා විවිධ මුලකුරු යටතේ ප්‍රකාශන පලකල අවස්ථා, විදේශ රටවල ආයතන සහ හෝ පුද්ගලයන් සමග එක්ව ශ්‍රී ලාංකික නම් පවතින අවස්ථා දැකිය හැකි බැවින් මෙම අදියර ප්‍රවේසමින් සිදුකරනු ලැබේ.

සිව්වන කාර්තුව

සමුච්චිත දර්ශකය ගණනය කිරීම

පර්යේෂකයන් තරාකිරීම සඳහා සෑම පර්යේෂකයකු සඳහාම සමුච්චිත දර්ශකයක් ගණනය කරන අතර එය මුදල් ප්‍රදානයන් ලබාදීම සඳහා යොදාගනී. (ලබා දීමට හෝ නොදීමට ඉඩ ඇත.)

වි.නා.ද. අඩංගු සඟරා වල ශ්‍රී ලාංකීය ආයතනික ලිපිනයක් (සම්පූර්ණ හෝ කොටසක්) සහිත ප්‍රකාශයනයක් වි.නා.දර්ශකයේ යම් වර්ෂයකට අදාලව දැක්වේ නම් එය සමුච්චිත දර්ශකය ගණනය සඳහා සළකා බැලේ. ශ්‍රී ලංකා ආයතනයක ලිපිනයක් පමණක් වි.නා.දර්ශකයේ යම් වර්ෂයකට අදාලව දැක්වේ නම් දර්ශකාංශ 2ක් සෑම ප්‍රකාශයනයක් සඳහාම ලබාදෙනු ලැබේ. විදේශ ආයතනයක් ලිපිනයක් ද එහි සඳහන් වේ නම් දර්ශකාංක 1.5 ලබා දෙයි.

සෑම ප්‍රකාශයනයකම කතුවරුන් සඳහා සමානව දර්ශකාංක ලබා දෙනු ලැබේ. එමගින් පුද්ගල දර්ශකය ගණනය කරයි. පුද්ගල දර්ශකය යනු යම් කාල පරිච්ඡේදයක් තුල ලබාගත් (වසරින් වසර) දර්ශකයන් හි එකතුවයි.

**මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීම :**

සෑම වසරක් සඳහාම මාර්ගෝපදේශ සංග්‍රහයක් සකසනු ලැබේ.

මෙමගින් යම් වසරකට අදාලව ප්‍රකාශනයන්ගේ එකතුව සීඩී තැටියක් මගින් ගණනයන් සහිතව ලබාදෙයි.

මෙහිදී නොවැදගත් ප්‍රකාශනයන් හඳුනාගැනේ.මෙහි තීරනය සහා සාමාජිකයන් විසින් ලබාදෙයි.

අකාරාදී පිළිවෙලට කතෘවරුන්ගේ ලැයිස්තුවක් ලබාදෙන අතර සෑම කතෘ වරයෙකුටම එම සඟරාවල අනු අංකය සහිතව ප්‍රකාශන හඳුනාගැනීමේ අංකයක් ලබාසෙනු ලැබේ.මෙහිදී සෑම කතුවරයකුගේම දර්ශකයන්හි එකතුව සඳහන් කරයි.

නොවැදගත් සේ හඳුනාගත් ප්‍රකාශකයන්ටද අනු අංකනය හා ප්‍රකාශනයන්හි දරශකය ලබාදෙයි. සඟරා එකතුව අකාරාදී අනුපිළිවෙලට ලේඛන වර්ගය හා ප්‍රකාශන අනුක්‍රමික අංකය සහිතව සකසනු ලැබේ.

# ක්‍රියාත්මක වැඩසටහන්

## ආයතන ඇගයීමේ වැඩසටහන

- හැඳින්වීම
- වැඩසටහනේ ප්‍රගතිය

## හැඳින්වීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඇගයීමේ වාර්තාව වසර තුල නිමකර අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ හා මගපෙන්වීම් සඳහා බාරදී ඇත.

මෙම ඇගයීම අතිගරු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා ජාතික පර්යේෂණ සභාව වෙත කරන ලද ඉල්ලීම මත සිදු කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමා 2007 ජූලි 24 දින නිකුත් කල ජනාධිපති විධානයේ වගන්ති (iv) යටතේ ජාතික පර්යේෂණ සභාව වෙත පර්යේෂණ හා සංවර්ධන ආයතන ඇගයීමට බලතල පවරා ඇත. ඒ අනුව ජාපස ඒකමතිකව මෙම වැදගත් කාර්යය සඳහා උපදේශකයන් 5දෙනකු පත්කරන ලදී. එම කමිටුව ආචාර්ය පරාක්‍රම වෛද්‍යනාත මහතාගේ මූලිකත්වයෙන් වෛද්‍ය නිමල් සඳරත්න, මහාචාර්ය බුද්ධි මාරඹේ, ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා, හා ජාපස සභික හා සම්බන්ධීකාරක මහාචාර්ය ජනේන්ද්‍ර ද කොස්තා මහතාගෙන් සමන්විත වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳව හා එහි වර්තමාන තත්වය පිළිබඳව වැදගත් විශ්ලේෂණයන් මෙම ඇගයීම මගින් සැපයේ. මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ සංවර්ධන ඉලක්ක ඉටුකරගැනීමට පර්යේෂණ හා සංවර්ධන ආයතන ප්‍රතිසංවිධාන හා ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් මෙය ඉටුකරනු ලැබේ.

# කාලච්ඡේදයේ ප්‍රගතිය

## පළමු කාර්තුව 2011

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇගයීමේ අවසාන වාර්තාව සභාවට ඉදිරිපත්කරන ලද අතර සම්බන්ධීකාරක මහාචාර්ය ඩබ්. ඒ. ජේ. එම්. කොස්තා විසින් ඇගයීමේ හා නිර්දේශයන් පිළිබඳ විස්තරාත්මක විවරණයක් ලබාදුනි. මෙම වාර්තාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට ගරු ජනාධිපති ලේකම්වරයා වෙත භාරදීමට තීරණය කෙරුණි. වාර්තාව පිටුසැකස්ම, රූප, අකුරු නිර්මාණය හා මුද්‍රණය ජාතික පර්යේෂණ සභාව මගින් ඉටුකරන ලදී. ජනාධිපති කාර්යාලයේ ඉල්ලීම මත සාරාංශගත වාර්තාවක් සකසන ලදී.

## දෙවන කාර්තුව 2011

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇගයීමේ වාර්තාව ගරු ජනාධිපති ලේකම්වරයා වෙත ජනාධිපති කාර්යාලයේ දී 2011-04-19 දින භාරදුනි. ගරු ජනාධිපති ලේකම්වරයාගේ ප්‍රශංසාවට මෙම වාර්තාව ලක් කෙරුනු අතර කෘෂිකර්ම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව සමග රැස්වීමක් කැඳවා මෙම නිර්දේශයන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න සාකච්ඡාකිරීමට ද තීරණය විය. 2011 මැයි 19 දින ජනාධිපති කාර්යාලයේ දී ගරු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග, කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන, අමාත්‍යාංශයේ ලේකම් කේ. ඊ. කරුණාතිලක හා අනෙකුත් නිලධාරීන් සහභාගි විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට එකඟ විය.

## තුන්වන හා සිව්වන කාර්තුව 2011

වෙනත් ආයතන කිසිවක් ඇගයීමට ජාපස යොමු නොකෙරුණි.

# මාධ්‍ය හා සංවර්ධන වැඩසටහන

- හැඳින්වීම
- කාලච්ඡේදයේ ප්‍රගතිය

# හැඳින්වීම

පර්යේෂණ ප්‍රතිඵල යෙදවීම හා ප්‍රවර්ධනය මෙම වැඩසටහනේ මූලික අරමුණකි. ජාපස අදාල අමාත්‍යාංශ හා ආයතන හරහා ජාපස ප්‍රදානයන්ගෙන් පර්යේෂණ ප්‍රතිඵල ජාතියට උපරිම ප්‍රතිලාභ අත්වන ආකාරයට යෙදවීම හා ප්‍රවර්ධනය සිදුකරයි.

2009 දී ආරම්භ කල පර්යේෂණ හා සංවර්ධන ආයතන ඇගයීමේ වැඩසටහන මෙම වසරේදීත් ක්‍රියාත්මක විය. එම ඇගයීම් වාර්තාව ජනාධිපති ලේකම් වෙත භාරදෙන ලදී.

වසර තුල මාධ්‍ය හා සංවර්ධන වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක විය. මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහයොගයෙන් ඉතා උත්කර්ෂවත් ලෙස මොනරාගල බුත්තල පැවැති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයෙන් ආරම්භ විය. .

බොහෝ පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය වාර්තාවන් රැසක් ජාපස මගපෙන්වීම යටතේ පලවිය. පසුගිය මාස හය තුල ලිෂ්මානියා හා අනෙකුත් ජලජ හා වාහක රෝග පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන් කිහිපයක් උතුරු මැද පලාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ විද්‍යා මධ්‍යස්ථානයන්හි සහයොගයෙන් පවත්වන ලදී.

පර්යේෂණ ප්‍රතිඵල ප්‍රවර්ධනය හා යෙදවීම මෙම වැඩසටහනේ මූලික කාර්යයක් වේ. ජාතික පර්යේෂණ සභාව, අදාල අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හරහා පරීක්ෂණයන්ගේ ප්‍රතිඵල යෙදවීම හා ප්‍රතිඵල ප්‍රවර්ධනය කිරීම මගින් ජාතියට උපරිම ප්‍රතිලාභ අත්කරගැනීමට හැකියාව ලැබේ. පර්යේෂණ හා සංවර්ධන ආයතන ඇගයීමේ වැඩසටහන 2009 දී ආරම්භ වු අතර එය මෙම වසරදීත් ක්‍රියාත්මක කරන ලදී. එහි වාර්තාවන් අතිගරු ජනාධිපති ලේකම් වරයා වෙත ලබා දෙන ලදී.

මාධ්‍ය සංවර්ධන වැඩසටහන් යටතේ වැඩසටහන් ගනනාවක් ක්‍රියාත්මක කරන ලදී.

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණය මොණරාගල, බුත්තලදී ඉතා උත්කර්ශවත් අන්දමින් ක්‍රියාත්මක වු අතර ඒ සඳහා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නොමද දායකත්වය ලැබුනි.

## කාලච්ඡේදයේ ප්‍රගතිය

<u>පලමු කාර්තුව සිට සිව්වන කාර්තුව දක්වා</u>

### තරුණ විද්‍යාඥයන් සඳහා ප්‍රාරම්භක වැඩසටහන

තරුණ විද්‍යාඥ වැඩසටහනට සහභාගිවීමට අපේක්ෂාකරන යොවුන් පර්යේෂකයන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී

මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ පර්යේෂණ සංස්කෘතියක් ඇතිකිරීම සඳහා උපාධි අපේක්ෂකයන් දිරිමත්කිරීමටත්, පර්යේෂක සිසුන් පර්යේෂණ ක්‍රියාකාරකම් වෘත්තියක් ලෙස ඉදිරියට ගෙනයාම සඳහා දිරිදීමටත් අපේක්ෂා කරයි. මෙම වැඩසටහන තරුණ විද්‍යාඥයන් ශ්‍රී ලංකාවේ පර්යේෂකයන් සමග සහභාගිත්ව සම්බන්ධතා ගොඩනැගීමටත් ජාතික හා අන්තර්ජාතික තලයේ පර්යේෂකයන් උපදේශනයටත් පහසුකම් සලසයි.

අන්තර්විෂයයික හා සහභාගිත්ව පර්යේෂණයන් හි වර්ධනයට මෙම වැඩසටහන මගින් නිර්මාණය කරන සිසු ජාලය හේතුවනු ඇත. ජාතික සංවර්ධනයට හේතුවන ශ්‍රී ලංකාවේ පර්යේෂණ ගැටළු අන්තර්විෂයයික ප්‍රවේශයකින් යුතුව උපාධි අපේක්ෂකයන් අතර පර්යේෂණ සංස්කෘතියක් ඇතිකිරීමට හේතුවන ක්‍රියාකාරකම් ගණනාවකින් වැඩසටහන සමන්විත වේ. මූලිකව මොඩියුල 5කින් සමන්විත වන අතර සෑම මොඩියුලයක්ම ක්‍රියාකාරකම් හා වැඩසටහන් වලින් සමන්විතවන අතර සිසුන්ගේ පර්යේෂණ කුසලතාවන් හා ධාරිතාව වැඩිදියුණුකිරීමට උපකාරිවේ.

1 මොඩියුලය – එක්දින වැඩමුළු 2ක් : පර්යේෂණ හා සංවර්ධනය හඳුන්වාදීමට.
2 මොඩියුලය – ආරාධිත දේශන මාලාව : කාලීන පර්යේෂණ මාතෘකා ගැන
3 මොඩියුලය – ප්‍රායෝගික පුහුණුව : - ලංකාවේ ප්‍රායෝගික පර්යේෂණ පිළිබඳ ප්‍රායෝගික පලපුරුද්දක් ලබාදිම.
4 මොඩියුලය – විද්‍යාගාර පුහුණුව : - ලංකාවේ පවතින නවීන විද්‍යාගාර පුහුණුවක් ලබාදීම
5 මොඩියුලය – පර්යේෂණ යෝජනාවක් ලිවීම

අයදුම්පත් 66 ලැබුනි.

### *දැයට කිරුළ සංවර්ධන වැඩසටහන* :

ජාපස 2011 පෙබරවාරි 4 සිට 10 දක්වා බුත්තල පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සහභාගිවිය. මහාචාර්ය රන්ජිත් දිසානායක, ජාපස ප්‍රදාන 06-73, මහාචාර්ය ආර්. පී. වී. ජේ. රාජපක්ෂ, ජාපස ප්‍රදාන 09-05, ආචාර්ය රාධිකා සමරසේකර, ජාපස ප්‍රදාන 05-10 යන ව්‍යාපෘති 3 හි පර්යේෂණ ක්‍රියාකාරකම් මෙහිදී ඉදිරිපත් කරන ලදී. බොහෝ පර්යේෂකයන් සිය පර්යේෂණ ප්‍රතිඵල දක්වන විශාල දැන්වීම් සැපයීමෙන් මහජනතාව දැනුවත්කිරීමට කටයුතුකරන ලදි. ජාපස ප්‍රදර්ශන කුටිය මහජනතාවගේ නොමඳ අවධානයට ලක්වූ කුටියක් විය. බොහෝ විද්‍යාඥයන් කුටිය තුල සිය සිසුන් සමග නිදර්ශක පැහැදිලිකිරීමෙහි යෙදී සිටියහ. මේ සඳහා සිසුන් 20 දෙනකු පමණ සහය දැක්විය.

# කාලච්ඡේදයේ ප්‍රගතිය

දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය, බුත්තල, ශ්‍රී ලංකාව










ඉ දැනුවත්කිරීමේ වැඩසටහන්- :

වෙබ් අඩවිය නිර්මානය අඛණ්ඩව සිදුකරන ලදී.



ආජන්ම මන්දතයිරොයිඩිතා හඳුනාගැනීමේ නවජ ළදරු පරීක්ෂාව මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම

ආජන්ම මන්දතයිරොයිඩිතා හඳුනාගැනීමේ නවජ ළදරු පරීක්ෂාව මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමේ මූලික සාකච්ඡාවන් 2011 පෙබරවාරි 4 දින පෙ.ව. 10.30ට මොනරාගල දිස්තික් මහ රෝහලේ දී පැවැත්විණි. වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

ආජන්ම මන්දතයිරොයිඩිතා උපතේ දී හඳුනාගතහොත් සාර්ථකව ප්‍රතිකාරකර ජීවිතයේ පසුකාලයේ වන භයානක මානසික දුර්වලතාවයන් අඩු පිරිවැයකින් වලක්වා ගත හැකි තත්ත්වයකි.

රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය විසින් සිදුකරන ලද මූලික හා ශක්‍යතා අධ්‍යයනයන් මගින් හඳුනාගෙන ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ සභාවෙන් ලද පර්යේෂණ ප්‍රදානයේ කොටසක් ලෙස නවජ ළදරුවන් මන්දතයිරොයිඩිතා හඳුනාගැනීම සඳහා පරීක්ෂාකිරීමෙ පහසුකම් සැපයීමට තීරණය කරන ලදී. ලේ බින්දු පරීක්ෂාව ආජන්ම මන්දතයිරොයිඩිතා හඳුනාගැනීමේ නවජ ළදරු පරීක්ෂාව දකුණු පලාතේ සියලු රාජ්‍ය සෞඛ්‍ය ආයතනයන්හි ආරම්භ කිරීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් 2010.08.13 දින නිකුත්කල 02-90/2010 දරණ චක්‍රලේකය මගින් උපදෙස්දෙන ලදී. සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රිපාල සිරිසේන මැතිඳුන්ගේ ප්‍රධානත්වයෙන් කරාපිටිය වෛද්‍ය පීඨ ශ්‍රවනාගාරයේදි 2010 සැප්තැම්බර් මස 21 ක්වන දින උත්සවාකාරයෙන් විවෘතකරන ලදී.

දකුණු පලාත තුල මෙම පහසුකම සාර්ථකව ප්‍රතිෂ්ඨාපිත බැවින් මෙය රටේ අනෙකුත් ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීමට ජාපස විසින් න්‍යෂ්ටික වෛද්‍ය ඒකකයෙන් ඉල්ලාසිටින ලදී. එබැවින් මොනරාගල දිස්තික් මහ රෝහලේ දී 2011 පෙබරවාරි 4 10.30 ට මූලික සාකච්ඡාවන් සංවිධානය කරන ලදී.

නියෝජිත කණ්ඩායම පහත අයගෙන් සමන්විත විය.

- රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ න්‍යෂ්ටික වෛද්‍ය ඒකකයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මංජුල හෙට්ටි ආරච්චි - ජාපස 08-08 ප්‍රදානයේ ප්‍රධාන පර්යේෂක වෙනුවෙන් මොනරාගල රෝහල්වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍යවන මූලික ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කිරීම.
- රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ළමා රෝග දෙපාර්තමේන්තුවේ මහාචාර්ය සුජීව අමරසේන - සම්පත් අඩු මට්ටමක දී පවා මෙම වැඩසටහනේ වැදගත්කම අවධාරණය කරනු ඇත.
- දකුණු පලාත් නවජ ළදරු පරීක්ෂා වැඩසටහනේ මූලික කාර්යභාරය ඉටුකරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය ඒකකයේ මහජන සෞඛ්‍ය උපදේශක විශේෂඥ වෛද්‍ය සංජීව ගොඩකන්දගේ - මෙම වැඩසටහන දකුණු පලාතේ ක්‍රියාත්මක කිරීමේ දි සෞඛ්‍ය අමාත්‍යාංශය ලද අත්දැකීම් බෙදාදීමට .
- මනීෂා සී රාජපක්ෂ, ලේකම්/ ජාතික පර්යේෂණ සභාව

රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්ය මංජුල හෙට්ටි ආරච්චි, මොනරාගල දිස්තික් මහ රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය සමන්ති විලේගොඩ, ජාපස ගණකාධිකාරී එන් එස් හේවාගම හා ජාපස සහකාර ගණකාධිකාරී එස්. කේ. ගම්හේවා වැඩසටහන සංවිධානය කරන ලදී.

## 2012 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සංවර්ධන වැඩසටහන්

මේ යටතේ පහත වැඩසටහන් අනුරාධපුර දිස්තික්කයේ දි පැවැත්විණි. සියළු වැඩසටහන් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ විද්‍යා නිලධාරීන් හා ජාපස ඒකාබද්ධව සංවිධානය කරන ලදි.

1. උතුරු මැද පලාතේ **වැව් ආශ්‍රිතව හා සතුන්ගෙන් මිනිසුන්ට බෝවන වාහක රෝග පිළිබඳව වෛද්‍යවරුන් හා** සෞඛ්‍ය නිලධාරීන් **දැනුවත්කිරීම සඳහා ක්‍රියාකාරී** වැඩමුළුව.

වැඩසටහන 2011 සැප්තැම්බර් 22 දින අනුරාධපුර මහ රෝහලේ දී පැවැත්වුණි. ජාපස සභාපති මහාචාර්ය එරික් කරුණානායක,

අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ඩබ් එම් ටී බී විජේකෝන්, උතුරු මැද පලාතේ ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය අසෝකා මුණසිංහ මිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය සෑම් කුලරත්න, රාගම කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය රන්ජන් ප්‍රේමරත්න, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අණුක ජීව විද්‍යාව පිළිබඳ ජ්‍යේෂ්ඨ මහාචාර්ය එන් සී අර්සකුලරත්න, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු හා සත්ව විද්‍යා පීඨයේ පරපෝෂිතවේද අධ්‍යයනාංශයේ පරපෝෂිතවේදය පිළිබඳ ජ්‍යේෂ්ඨ මහාචාර්ය ජයන්ත රාජපක්ෂ මහතා ද සහාව අමතන ලදී.

වැඩසටහන විශේෂයෙන් පලාතේ සෞඛ්‍ය නිලධාරීන් **වැව් ආශ්‍රිතව හා සතුන්ගෙන් මිනිසුන්ට බෝවන වාහක රෝග පිළිබඳව** දැනුවත්කිරීම සඳහා නිර්මාණය කරන ලදී.

2. උතුරු මැද පලාතේ **වැව් ආශ්‍රිතව හා සතුන්ගෙන් මිනිසුන්ට බෝවන මී උණ රිකට්සියා වැනි වාහක රෝග පිළිබඳව කෘෂිකාර්මික හා ක්ෂේත්‍ර රාජ්‍ය නිලධාරීන්, සමෘද්ධි නියාමක නිළධාරීන්, අනෙකුත් වැඩිහිටි හා ප්‍රජා මූලික සංවිධානයන්හි නිලධාරීන් හා මහජනතාව දැනුවත්කිරීම සඳහා ක්‍රියාකාරී වැඩමුළුව**.

වැඩසටහන් දෙක 2011 ඔක්තෝබර් 07 හා 21 දිනයන්හි දී අනුරාධපුර නොච්චියාගම හා තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දී පැවැත්වුණි. ජාපස සභාපති මහාචාර්ය එරික් කරුණානායක, අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ඩබ් එම් ටී බී විජේකෝන්, උතුරු මැද පලාතේ ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය අසෝකා මුණසිංහ මිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය සෑම් කුලරත්න, රාගම කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය රන්ජන් ප්‍රේමරත්න, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අණුක ජීව විද්‍යාව පිළිබඳ ජ්‍යේෂ්ඨ මහාචාර්ය එන් සී අර්සකුලරත්න, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු හා සත්ව විද්‍යා පීඨයේ පරපෝෂිතවේද අධ්‍යයනාංශයේ පරපෝෂිතවේදය පිළිබඳ ජ්‍යේෂ්ඨ මහාචාර්ය ජයන්ත රාජපක්ෂ මහතා ද සහාව අමතන ලදී.

3. සමාජ දැනුවත්කිරීමේ වැඩසටහන හා මූලික **ලිෂ්මනයිසිස් රෝගය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන හා** "ශ්‍රී ලංකාවේ ජනතාව අතර සමේ ලිෂ්මනයිසිස් ක්‍රියාකාරී සම්ප්‍රේෂණය වන රෝගීන් ගණන තිරණය කිරිම " සඳහා **මූලික වසංගත රෝග සමීක්ෂණය**

නොවැම්බර් මස 18 සහ 19 යන දිනයන්හි දී එප්පාවල සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලයේ දී සහ තලාව මහා විද්‍යාලයේ දී දෙදින වැඩසටහනක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පරපෝෂිතවේද අධ්‍යයනාංශයේ වෛද්‍ය ශලින්ද්‍රා රණසිංහ මහත්මියගේ, ලෝක සෞඛ්‍ය




සංවිධානයේ ලිෂ්මානියා වැඩසටහන් ප්‍රධානී මහාචාර්ය ග්‍රෙග් මැට්ලැශෙවුස්කි මහතා(Prof. Greg Matlashewski) අනුරාධපුර තලාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන්, අනුරාධපුර පලාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ සහයෝගීත්වයෙන් පැවැත්විණි. මෙම වැඩසටහන තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ පැවති අතර එහිදී හඳුනාගත් රෝගීන් බවට සැකකටයුතු පුද්ගලයන් වැඩිදුර පරීක්ෂණ සඳහා ඉක්මනින් යොමුකරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පරපෝෂිතවේද පිළිබඳ මහාචාර්ය රේණු වික්‍රමසිංහ, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය ශලින්ද්‍රා රණසිංහ, උතුරු මැද පලාතේ ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය අසෝකා මුණසිංහ මිය, අනුරාධපුරය ශික්ෂණ රෝහලේ සමේ රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය සංජීව හුලන්ගමුව මහතා, අනුරාධපුරය ශික්ෂණ රෝහලේ සමේ රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ජී. කේ. නන්දිමිත්‍ර ඕපාතඇල්ල මහතා, අනුරාධපුර තලාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය එස්. ආර්. ආර්. බණ්ඩාර මහතා , අනුරාධපුර තලාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය වී. ඩී. කේ. සෙනෙවිරත්න මිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සමස්ත කාර්යය මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ආධුනික කථිකාචාර්ය හා තාවකාලික ප්‍රදර්ශක වෛද්‍ය කණ්ඩායම, තුලාන් 17 හි ප්‍රාදේශිය සුව සහන කමිටු නිලධාරීන්, ජාතික පර්යේෂණ




ධනාත්මක පාලනය; කහප ප්‍රතිඵල මගින් තහවුරුකළ වවුනියා දිස්ත්‍රික් වි.ලි. රෝගියාගේ ප්‍රති-ලිෂ්මානියා ප්‍රතිදේහවලට දැඩි ධනාත්මක තත්වයක් දැක්වීම. කහප= කඩිනම් හඳුනාගැනීමේ පරීක්ෂාව.



කහප ප්‍රතිඵල මගින් අනුරාධපුර තලාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශයේ අහඹු ජන සායනයට සහභාගිවූ රොගියකුගේ මෘදු හා මධ්‍ය ධනාත්මකතාවක් ප්‍රති-ලිෂ්මානියා ප්‍රතිදේහවලට දැක්වීම.









ලිෂ්මානියා වැඩසටහන, තලාව ඒකකය, අනුරාධපුර දිස්ත්‍රික්කය

සභාවේ නිලධාරීන් හා ප්‍රදේශයේ මහජනතාව මෙම වැඩසටහනට සහභාගි විය.

# මාධ්‍ය හා සංවර්ධන වැඩසටහන

පෙබරවාරි මස බුත්තල දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශණයේ ඉදිරිපත් කළ පෝස්ටර් කිහිපයක්












# මූල්‍ය ප්‍රකාශන 2011

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පුනරාවර්තන ලැබීම් – ජාපස පරිපාලනය | 4-අ | 6,314,000.00 | 5,409,042.40 |
| පුනරාවර්තන ලැබීම් – පර්යේෂණ හා සංවර්ධන | 4-ආ | 19,476,733.81 | 9,877,087.88 |
| වෙනත් ලැබීම් | | 33,810.00 | 40,000.00 |
| මුලු ආදායම | | **25,824,543.81** | **15,326,130.28** |
| **වියදම්** | | | |
| සේවකයන්ට ගෙවීම් | | 1,737,859.80 | 1,588,492.90 |
| පර්යේෂණ හා සංවර්ධන | 4-අ | 19,476,733.81 | 9,877,087.88 |
| සැපයුම් සේවා හා නාෂ්‍ය ද්‍රව්‍ය | | 2,250,603.59 | 1,581,733.67 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් - ජාපස ප්‍රදාන | | 15,057,436.03 | 13,597,163.87 |
| ක්ෂය – ජාපස කාර්යාල උපකරණ | | 343,425.17 | 880,188.64 |
| වෙනත් වියදම් | | 5,093,893.05 | 2,589,793.17 |
| මූල්‍ය පිරිවැය | | 13,394.25 | 114,329.46 |
| මුළු වියදම | | **43,973,345.70** | **30,228,789.59** |
| අතිරික්තයෙන් ආශ්‍රිතයන් සඳහා වෙන්කරන කොටස | | - | - |
| කාලච්ඡේදයේ අතිරික්තය/(හිඟය) | | **(18,148,801.89)** | **(14,902,659.31)** |
| වෙන්කළා: | | | |
| පාලන අස්තිත්වයේ හිමිකාරත්වයට | | (18,148,801.89) | (14,902,659.31) |
| සුළු කොටස් කරුවන්ට | | - | - |
| | | **(18,148,801.89)** | **(14,902,659.31)** |

*පිටු අංක 05 සිට 10 දක්වා දක්වා ඇති සටහන් ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි.*

*වරහන් මගින් අඩුවීම් දක්වා ඇත.*

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව

## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| වත්කම් | සටහන් | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 1,122,565.99 | 1,819,173.90 |
| ලැබිය යුතු දෑ | | 150,896.00 | 241,742.00 |
| තොග | | | |
| ඉදිරි ගෙවීම් | | | |
| ජාපස ප්‍රදාන | | | |
| වෙනත් ජංගම වත්කම් | | 268,113,399.97 | 114,996,533.07 |
| | | 269,386,861.96 | 117,057,448.97 |
| ජංගම නොවන වත්කම් | | | |
| ලැබිය යුතු දෑ | | | |
| ආශ්‍රිතයන්ගේ ආයෝජන | | | |
| වෙනත් මූල්‍ය වත්කම් | | | |
| දේපල පිරියත හා උපකරණ | 5 | 105,000.00 | 130,000.00 |
| ඉඩම් හා ගොඩනැගිලි | 6 | 119,496,763.03 | 109,726,350.68 |
| අස්පෘෂ්‍ය වත්කම් | | | |
| වෙනත් ජංගම නොවන වත්කම් | | | |
| | | 119,601,763.03 | 109,856,350.68 |
| මුළු වත්කම් | | 388,988,624.99 | 226,913,799.65 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු දෑ | 7 | 47,545.38 | 55,807.23 |
| | | 47,545.38 | 55,807.23 |
| ජංගම නොවන වගකීම් | | | |
| ගෙවිය යුතු දෑ | | | |
| | | - | - |
| මුළු වගකීම් | | 47,545.38 | 55,807.23 |
| ශුද්ධ වත්කම් | | 388,941,079.61 | 226,857,992.42 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| ප්‍රාග්ධනය දායක වී ඇත්තේ; | | | |
| වෙනත් රාජ්‍ය ආයතන | | | |
| සංචිත | | | |
| ඒකාබද්ධ අතිරික්තය /(හිඟය) | 8 | 388,941,079.61 | 226,857,992.42 |
| සුළු කොටස් අයිතිය | | | |
| මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය | | 388,941,079.61 | 226,857,992.42 |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමේ හා ඉදිරිපත්කිරීමේ වගකීම සභාව සතුය.

සභාව වෙනුවෙන් අත්සන් තබන ලදී,

.........................

මහාචාර්ය. ඊ. එච්. කරුණානායක

(සභාපති ජාපස)

2011 පෙබරවාරි 28 දින

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය** | | |
| ලැබීම් | | |
| බදු | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් (පුනරාවර්තන + සංවර්ධන ආධාර) | 206,314,000.00 | 65,409,042.40 |
| භාණ්ඩ හා සේවා අලෙවියෙන් | | |
| නිමකල ව්‍යාපෘති වලින් ලැබීම් | 13,099,174.56 | 6,323,809.21 |
| පොලී ලැබීම් | | |
| වෙනත් ආදායම | 124,656.00 | 5,000.00 |
| ගෙවීම් | | |
| සේවකයන් සඳහා මුදල් ගෙවීම් | (1,737,859.80) | (1,598,968.43) |
| විශ්‍රාම පාරිතෝෂික | | |
| සැපයුම් | | |
| පර්යේෂණ ප්‍රදාන | (213,262,709.05) | (64,476,585.26) |
| පොලී ගෙවීම් | | |
| වෙනත් ගෙවීම් | (4,452,050.85) | (4,110,664.49) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(85,210.86)** | **1,551,633.43** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදීගැනීමට | (781,818.77) | |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබීම් | | |
| ආයෝජන විකිණීමෙන් ලැබීම් | | |
| විදේශ මුදල් සුරකුම්පත් මිලදීගැනීමට | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(781,818.77)** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය** | | |
| ණයගැණුම් වෙනුවෙන් ලැබීම් | | |
| ණයගැණුම් ආපසු ගෙවීම් | | |
| රජයට බෙදාහැරීම්/ලාභාංශ | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | - | - |
| මුදල් හා මුදල් සමාන දැ හි ශුද්ධ වැඩිවීම (අඩුවීම) | **(696,607.91)** | **1,551,633.43** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | **1,819,173.90** | **267,540.47** |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | **1,122,565.99** | **1,819,173.90** |

*පිටු අංක 05 සිට 10 දක්වා දක්වා ඇති සටහන් ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි.*

*වරහන් මගින් අඩුවීම් දක්වා ඇත.*

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | සමුච්චිත අතිරික්තය හෝ හිඟය | එකතුව | මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 226,857,992.42 | 226,857,992.42 | 226,857,992.42 |
| ආරම්භක ශේෂයට ගැලපීම් | (100,431.11) | (100,431.11) | (100,431.11) |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් | | | |
| | 226,757,561.31 | 226,757,561.31 | 226,757,561.31 |
| **2011 සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වෙනස්වීම්** | | | |
| වත්කම් ප්‍රත්‍යාගණනයෙන් ලැබීම් | | | |
| ආයෝජන ප්‍රත්‍යාගණනය අලාභ | (190,946.00) | (190,946.00) | (190,946.00) |
| විදේශීය මෙහෙයුම් හුවමාරු වෙනස්වීම් | | | |
| ශුද්ධ වත්කම්/ස්කන්ධයෙහි සෘජුව හඳුනාගත් ආදායම (ශුද්ධ අගය) | 180,523,266.19 | 180,523,266.19 | 180,523,266.19 |
| කාලච්ඡේදයේ (හිඟය) / අතිරික්තය | (18,148,801.89) | (18,148,801.89) | (18,148,801.89) |
| කාලච්ඡේදය සඳහා මුළු හඳුනාගත් ආදායම හා වියදම් වල ශුද්ධ වටිනාකම | | | |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** ඉදිරියට ගෙනගියා | 388,941,079.61 | 388,941,079.61 | 388,941,079.61 |

*පිටු අංක 05 සිට 10 දක්වා දක්වා ඇති සටහන් ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි.*

*වරහන් මගින් අඩුවීම් දක්වා ඇත.*

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1. වාර්තාකරණ ඒකකය**

ජාතික පර්යේෂණ සභාව(ජාපස) අංක 1514/28 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ව්‍යවස්ථාවේ 33වන ව්‍යවස්ථාව යටතේ විශේෂ ආයතනයක් ලෙස පිහිටුවා ඇත. ජාතික පර්යේෂණ සභාව කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ 380/72 දරණ ස්ථානයේ පිහිටා ඇත. මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයකට සකස්කර ඇත.

**2. පිළියෙලකිරීමේ පදනම**

**2.1 අනුකූලතා ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා පරිචයන්ට අනුකූලව සකස්කර ඇත.

**2.2 අගයකිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමට පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව සකස්කර ඇති අතර මෙම ගිණුම් සඳහා බලපාන උද්ධමන සාධකයන් සඳහා කිසිදු ගැලපීමක් කර නැත.

**2.3 මෙහෙයුම් හා ඉදිරිපත්කිරීමේ මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ඉදිරිපත්කරන අතර ජාපසහි මෙහෙයුම් මුදල් ඒකකය ද එය වේ.
සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ඉදිරිපත්කර ඇති අතර වෙනත් ලෙසකින් දක්වා නොමැත්තේ නම් ආසන්න සතයට දක්වනු ලැබේ.

**2.4 ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදාගැනීම**

ශ්‍රිලරාඅශ්‍රිප්‍රයන්ට අනුකූල විමට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේ දී කලමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මකකිරීමේ හා වත්කම්, වගකීම්, ආදායම හා වියදම් ලෙස වාර්තාකල අගයන්ට බලපාන විවිධ විනිශ්චයන්, ඇස්තමේන්තු, හා උපකල්පනයන් කිරීමට සිදුවේ. විනිශ්චයන් හා ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම හා අවස්ථානුගතව සාධාරණයැයි විශ්වාසකල හැකි අපේක්ෂාවන් වැනි වෙනත් සාධක මත පදනම් වේ. එබැවින් සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵලයන් මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලින් වෙනස්විය හැකිය.

ඇස්තමේන්තු හා පදනම් වී ඇති උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කිරීම් එම කාලයට හා ඉදිරි කාලයන්ට බලපායි නම් ඇස්තමේන්තු වෙනස්කරන කාලච්ඡේදයේ දී හඳුනාගැනේ.

**3.3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත දැක්වෙන සියලු ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය හා සංගතවේ.

සමහර සංසන්දනාත්මක තොරතුරු වර්තමාන වර්ෂයේ තොරතුරු හා ගැලපීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී යලිවර්ගීකරණය කර ඇත.

**3.1 විදේශ මුදල්**

සියලු විදේශීය හුවමාරු ගනුදෙනු එම ගණුදෙනු සිදුවන දිනයේ පැවැති විනිමය අනුපාතය අනුව මෙහෙයුම් මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ.

**3.2 වත්කම් හා වත්කම් අගය කිරීමේ පදනම.**

වත්කම් වර්ගීකරණයේදී ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස දක්වනුයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය හෝ වාර්තාකරන දින සිට වසර යන දෙකෙන් අඩු කාලය තුල මුදල්කිරීම අපේක්ෂාකල හැකි සහ මුදල් හා බැංකු ශේෂයන් ය.

**3.2.1 දේපල පිරියත හා උපකරණ**

**3.2.1.1 හඳුනාගැනීම හා මැනීම**

දේපල පිරියත හා උපකරණ අයිතම පිරිවැයෙන් සමුච්ඡිත ක්ෂය අඩුකල අගයට මනිනු ලැබේ. දේපල පිරියත හා උපකරණ පිරිවැයට වත්කම් අත්පත්කරගැනීමට හෝ ඉදිකිරීමට සෘජුවම දරණ ලද අවස්ථානුගත පිරිවැයන් සමග මිලදීගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය, යම් වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙනඒමට හා එම වත්කම් පිහිටි වැඩබිමේ යලි ප්‍රතිෂ්ඨාපනයට හා ගලවාඉවත්කිරීමේ පිරිවැය ඇතුලත්වේ. අදාල උපකරණයේ ක්‍රියාකාරිත්වයට මූලිකවන මිලදීගත් මෘදුකාංගයන් ද එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කෙරේ. යම් දේපල පිරියත හා උපකරණ කොටස් සඳහා විවිධ ඵලදායි ජීවකාලයන් පවතින විටදී ඒවා වෙනම දේපල පිරියත හා උපකරණ අයිතම ලෙස ගිණුම්ගතකරයි.
ජාපස ප්‍රදාන මගින් මිලදීගන්නා දේපල පිරියත හා උපකරණ වත්කම් පවරදෙනතෙක් හෝ ඉවත්කරන තෙක්

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ජාපසවේ දේපල පිරියත හා උපකරණවල කොටසක් ලෙස තාවකාලිකව හඳුනාගැනේ.

**3.2.1.2.** අනුරූප පිරිවැයන්

කොටස තුලින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිලාභ ජාපස/ප්‍රදානයන්ට අපේක්ෂා කල හැකි නම් හා එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකි නම් එම අයිතමයේ ධාරණ අගයෙහි දේපල පිරියත හා උපකරණ අයිතමය යලිසවිකිරීමේ පිරිවැයෙහි කොටසක් ලෙස හඳුනාගනී. වත්කම භාවිතයේ හෝ ඉවත්කිරීමේ තුලින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලානොයේ නම් යලිසවිකල කොටසේ ධාරණ අගය හඳුනානොගනී. ඒවායේ දී ලැබෙන ලාභ හා අලාභ ලාභ හා අලාභයන් හි හඳුනාගන්නා අතර ලාභයන් ආදායමක් ලෙස වර්ගීකරණය නොකරයි.

දේපල පිරියත හා උපකරණයන් දෛනික සේවාකරන පිරිවැයන් ලාභයට හෝ අලාභයට දරන අවස්ථාවේදී හඳුනාගනී.

**3.2.1.3** ක්ෂය

ස්ථාවර වත්කම්වල පිරිවැය මත පදනම් ගණනය කරන ලද ක්ෂය ලාභයට හෝ අලාභයට හඳුනාගනී. එම පිරිවැයන් ඵලදායී ජීවකාලය පුරා කපාහැරීම සඳහා ඉවත්කරන වර්ෂයේදී මුලුවර්ෂයට ක්ෂයකිරීමත් මිලදීගන්නා වර්ෂයේ ක්ෂය නොකිරීමත් සිදුකරයි.

වර්තමාන හා සංසන්දනාත්මක කාලච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලයන් හා ප්‍රතිශතයන් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| විවිධ වත්කම් | වසර 2 | 50.00% |
| හැඳිගැරුප්පු හා පිඟන්කෝප්ප | වසර 3 | 33.33% |
| කාමර හණ රෙදි | වසර 3 | 33.33% |
| ආරක්ෂිත උපකරණ | වසර 3 | 33.33% |
| පුස්තකාල පොත් | වසර 3 | 33.33% |
| පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා උපාංග | වසර 5 | 20 % |
| ඔරලෝසු හා ගණක යන්ත්‍ර | වසර 5 | 20 % |
| බල සැපයුම් උපකරණ | වසර 5 | 20 % |
| පිත්තල අයිතම | වසර 5 | 20 % |
| මෝටර් වාහන | වසර 5 | 20 % |
| වායු සමන යන්ත්‍ර / සේප්පු | වසර 10 | 10 % |
| ගොඩනැගිලි | වසර 10 | 10 % |
| දිර්ඝ කල හැකි වත්කම් | වසර 10 | 10 % |
| යන්ත්‍රෝපකරණ හා මෙවලම් | වසර 10 | 10 % |
| කාර්යාල උපකරණ | වසර 10 | 10 % |
| ශීතකරණ | වසර 10 | 10 % |
| අන්තර්ජාල ප්‍රතිෂ්ඨාපනය | 0 | |

ජාපස ප්‍රදාන මගින් මිලදීගන්නා දේපල පිරියත හා උපකරණයන් අපේක්ෂිත ඵලදායී ජීව කාලයන් පුරා එම වත්කම් පවරදෙනතෙක් හෝ ඉවත්කරන තෙක් වර්තමාන හා සංසන්දනාත්මක කාලච්ඡේද සඳහා පහත දැක්වෙන ඵලදායී ජීව කාලයන් හා ප්‍රතිශතයන් පදනම්කරගෙන ක්ෂය කරනු ලැබේ..

| | | |
|---|---|---|
| රසායනාගාර උපකරණ (1 වර්ගය) | වසර 10 | 10 % |
| රසායනාගාර උපකරණ (2 වර්ගය) | වසර 5 | 20% |

ක්ෂයකිරීමෙ ක්‍රම, ඵලදායී ජීව කාලයන් හා අවශේෂ වටිනාකම් වාර්තාකරන දිනයට යලි අගය කරනු ලැබේ.

**3.2.2.** අස්පෘශ්‍ය වත්කම් හා ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම් අනාගත ආර්ථික ප්‍රතිලාභ ජාපසට අපේක්ෂා කල හැකි නම් හා එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකි නම් ඒවා අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගනී. මෙම වත්කම් ශේෂ පත්‍රයේ දී පිරිවැයෙන් සමුච්ඡිත ක්‍රමක්ෂය අඩුකල අගයට දක්වයි. ක්‍රමක්ෂය ලාභයට හෝ අලාභයට හඳුනාගන්නේ අස්පෘශ්‍ය වත්කම් ඒවා භාවිතයට සූදානම් දින සිට ඒවායේ ඵලදායී ජීව කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ය..

**3.2.3.** තොග

තොග ඓතිහාසික පිරිවැය පදනමින් මනිනු ලැබේ.

**3.2.4.** වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ඒවායේ ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට දක්වනු ලැබේ.

**3.2.5.** ජාපස ප්‍රදාන

ජාපස ප්‍රදානයන්ගෙන් වසර ගණනාවක් පුරා ප්‍රදානය කල පර්යේෂණ ප්‍රදානයන්ගේ මුළු එකතුව නියෝජනය වේ. .

ජාපස ප්‍රදානයන්ගෙන් දරණ වියදම් ඒවා ඇතිවන කාලච්ඡේදයේ වියදම් ලෙස, එම වියදම් ඍජුව අත්පත්කරගැනීම් සඳහා ඍජුව දායකවීම, ඉදිකිරීම හෝ වත්කම් නිෂ්පාදනය යන අවස්ථාවන්හි දී දේපල පිරියත හා උපකරණයන් හි කොටසක් සේ හඳුනාගන්නා අවස්ථාවන්හි

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දී හැර දේපල, පිරියත හා උපකරණ අයිතමයන් කොටසක් ලෙස ඒවා ඉවත්කිරීමේ හෝ පැවරීම සිදුකරන තෙක් ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

අත්පත්කරගැනීම, ඉදිකිරීම හෝ වත්කම් නිෂ්පාදනයට දරණ වියදම් හැර අනෙකුත් වියදම් වියදම දරණ වසරේ දී ආදායම් ප්‍රකාශනයේ හඳුනාගන්නා අතර පර්යේෂණ ප්‍රදානයන් සඳහා ලැබෙන මුදල් සෘජුව ම සමුච්චිත අරමුදලට ප්‍රාග්ධනිත කෙරේ..

පර්යේෂණ ප්‍රදානයන්ගෙන් දරන වියදම්, වියදම් ලෙස ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගන්නා අදාල කාලච්ඡේදයට අදාලව පුනරාවර්තන ආදායමෙහි කොටසක් ලෙස ආදායමෙහි හඳුනාගනේ.

### 3.3 වගකීම් හා වෙන්කිරීම්

වගකීම් වර්ගීකරණයේදී ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස දක්වනුයේ ඉල්ලීම මත ගෙවීම් යටතට වාර්තාකරන දින සිට වසරක් තුල දී ගැනෙන ශේෂයන් ය.. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තාකරන දින සිට වසරකට පසුව ඉල්ලුම මත ගෙවීම් යටතට ගැනෙන ශේෂයන් ය.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දි ශේෂ පත්‍ර දිනට සියලු හඳුනාගත් වගකීම් ගිණුම්ගත කරනු ලැබේ.

### 3.3.1. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

සේඅ අඩුකිරීම පහත දැක්වේ:

| | |
|---|---|
| සේවායා | 12% |
| සේවකයා | 8% |

සේභාඅ අඩුකිරීම පහත දැක්වේ

| | |
|---|---|
| සේවායා | 3% |

### 3.3.2. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැයට දක්වනු ලැබේ.

### 3.4. ආදායම් ප්‍රකාශන

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත්කිරීම සඳහා වියදමේ ස්වාභාවය අනුව දැක්වීමේ ක්‍රමය යොදාගනී. .

### 3.4.1 ආදායම්

සලකාබලන කාලච්ඡේදය තුල පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබෙන ප්‍රදානයන් පිළිවෙලින් ආදායම් ප්‍රකාශනයට හා සමුච්චිත අරමුදල ට හඳුනාගනී.

පර්යේෂණ ප්‍රදානයන්ගෙන් දරන වියදම්, වියදම් ලෙස ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගන්නා අදාල කාලච්ඡේදයට අදාලව පුනරාවර්තන ආදායමෙහි කොටසක් ලෙස ආදායමෙහි හඳුනාගැනේ.

ශුද්ධ විකුණුම් හෝ දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය හුවමාරු උත්පාදනයන් සැසඳීමෙන් තීරණය වන දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ඉවත්කිරීමේ හෝ පැවරීම තුලින් අත්වන ලාභ හා පාඩු ලාභයේ හෝ අලාභයේ හඳුනාගනේ.

### 3.4.2. වියදම්

ජාපස මෙහෙයුම් සඳහා දරණ ලද සෑම වියදමක්ම වසරෙ ලාභය/ අලාභය හඳුනාගැනීමේ දී ආදායමට ගනු ලැබේ.

අලුත්වැඩියා හා නැවත ඇරඹීම් අදාල වියදම දරණ ලද කාලච්ඡේදයේ ලාභය/ අලාභයට ආරෝපණය කෙරේ.

පර්යේෂණ ප්‍රදාන මගින් දරණ වියදම් ද එම වියදම් සෘජුව අත්පත්කරගැනීම් සඳහා දායකවීම, ඉදිකිරීම හෝ වත්කම් නිෂ්පාදනය යන අවස්ථාවන්හි දී දේපල පිරියත හා උපකරණයන් හි කොටසක් සේ හඳුනාගන්නා අවස්ථාවන්හි දී හැර පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස දරණ ලද කාලච්ඡේදයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

විදේශ මුදල් ගණුදෙනු පරිවර්තනය තුලින් වන ලාභ හා අලාභයන්ගෙන් සමන්විත මූල්‍ය ආදායම් හා වියදම් එය හටගත් අවස්ථාවේදී ලාභ හා අලාභ ලෙස හඳුනාගනී.

### 3.5. පොදු

### 3.5.1 ශේෂ පත්‍ර දිනෙන් පසුව වන සිද්ධීන්

සියලු ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනෙන් පසුව වන සිද්ධීන් සළකන ලද අතර අදාල පරිදි ගැලපුම් හා හෙළිදරව්කිරීම් අදාල සටහන්හි දැක්වීම මගින් සිදුකරන ලදි.

### 3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සෘජු ක්‍රමය යොදාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස්කරනු ලැබේ.

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සටහන 04 - පුනරාවර්තන ලැබීම් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **4-a පර්යේෂණ හා සංවර්ධන** | | |
| ප්‍රදානයන්හි නාශ්‍ය ද්‍රව්‍ය | 14,471,341.73 | 8,827,387.69 |
| ප්‍රදානයන්හි ලිපිලේඛන | - | 180,140.11 |
| ප්‍රදානයන්හි පශ්චාත් උපාධි දායකත්වය | 4,071,126.07 | |
| ප්‍රදාන හා වැඩසටහන් පරිපාලන | 894,953.45 | |
| ප්‍රදානයන්හි ගමන් වියදම් | 39,312.56 | 869,560.08 |
| | 19,476,733.81 | 9,877,087.88 |
| **4-b භාණ්ඩාගාර පුනරාවර්තන නිදහස්කිරීම්** | | |
| 2010 ජනවාරි | 607,000.00 | 600,000.00 |
| 2010 පෙබරවාරි | 1,600,000.00 | 500,000.00 |
| 2010 මාර්තු | 153,000.00 | 500,000.00 |
| 2010 අප්‍රේල් | 867,000.00 | 500,000.00 |
| 2010 මැයි | 258,000.00 | - |
| 2010 ජූනි | 320,000.00 | 854,000.00 |
| 2010 ජූලි | 577,000.00 | 870,000.00 |
| 2010 අගෝස්තු | 150,000.00 | 130,000.00 |
| 2010 සැප්තැම්බර් | 633,000.00 | 700,000.00 |
| 2010 ඔක්තෝබර් | 200,000.00 | 300,000.00 |
| 2010 නොවැම්බර් | 470,000.00 | 130,000.00 |
| 2010 දෙසැම්බර් | 479,000.00 | 335,000.00 |
| භාණ්ඩාගාරයට ආපසු යැවීම් | - | (9,957.60) |
| | 6,314,000.00 | 5,409,042.40 |
| **එකතුව** | **25,790,733.81** | **15,286,130.28** |

| 5 - වෙනත් මූල්‍ය වත්කම් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| ගොඩනැගිලි කුලී තැන්පතුව | 90,000.00 | 90,000.00 |
| සන්නිවේදන තැන්පතුව | 15,000.00 | |
| ප්‍රවාහන තැන්පතුව | - | 40,000.00 |
| **එකතුව** | **105,000.00** | **130,000.00** |

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**6 - දේපල පිරියත හා උපකරණ**

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| පිරිවැය | | |
| ජාපස කාර්යාලයේ වත්කම් | 7,218,522.05 | 6,436,703.28 |
| ප්‍රදානයන්හි ප්‍රධාන උපකරණ | 171,890,083.52 | 151,297,576.72 |
| ප්‍රදානයන්හි සුළු උපකරණ | 8,182,411.80 | 7,596,147.97 |
| **එකතුව - වත්කම්** | **187,291,017.37** | **165,330,427.97** |
| | | |
| අඩුකළා: ක්ෂය සඳහා වෙන්කිරීම් | | |
| ජාපස කාර්යාලයේ වත්කම් | 5,339,961.77 | 4,996,536.60 |
| ප්‍රදානයන්හි ප්‍රධාන උපකරණ | 59,185,072.99 | 47,965,362.09 |
| ප්‍රදානයන්හි සුළු උපකරණ | 3,269,219.58 | 2,642,178.60 |
| **එකතුව - ක්ෂය සඳහා වෙන්කිරීම්** | 67,794,254.34 | 55,604,077.29 |
| **මුළු ශුද්ධ වත්කම්** | **119,496,763.03** | **109,726,350.68** |

**7 - ගෙවිය යුතු දෑ**

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| ගෙවිය යුතු දුරකතන | 31,876.24 | 39,025.29 |
| ගෙවිය යුතු විදුලි ගාස්තු | 15,151.70 | 16,264.50 |
| ගෙවිය යුතු ජල ගාස්තු | 517.44 | 517.44 |
| ගෙවිය යුතු ඊපීඑෆ් | - | - |
| ගෙවිය යුතු ඊටීඑෆ් | - | - |
| **එකතුව** | **47,545.38** | **55,807.23** |

**8 - සමුච්ඡිත අරමුදල - අතිරික්තය / (හිඟය)**

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| සමුච්ඡිත අරමුදල - අතිරික්තය / (හිඟය) | 407,089,881.50 | 241,760,651.73 |
| | | |
| එකතුකළා : ආදායම ඉක්මවූ වියදම | (18,148,801.89) | (14,902,659.31) |
| **එකතුව** | **388,941,079.61** | **226,857,992.42** |

# විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல. ඊඑල්/එෆ්/එන්ආර්සී/
My No එෆ්එ/2011

ඔබේ අංකය
உமது இல
Your No.

දිනය
திகதி 2012 සැප්තැම්බර් 13 දින
Date

සභාපති,
ජාතික පර්යේෂණ සභාව.

ජාතික පර්යේෂණ සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික පර්යේෂණ සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2012 මැයි 28 දින නිකුත් කරන ලදී.

1.2 සභාව පිහිටුවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින්, රටේ අතිශය ක්‍රියාශීලී ජාතික විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාමය ප්‍රජාවක් ගොඩනගා එයින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම අරමුණු කොට විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක කටයුතු සැලසුම් කිරීමට හා සම්බන්ධීකරණය කිරීමටත් එම කටයුතු පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීමට රජයට ආධාර කරනු පිණිස විශේෂ නියෝජිතායතනයක් ලෙස ජාතික පර්යේෂණ සභාව පිහිටුවා ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.4 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තකසේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>උපස් ගිණුම්කරණ පර්වයන්</u>

සමාලෝචිත වර්ෂය තුළ මිළදී ගෙන තිබුණු රු.781,819 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2.2.2 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව</u> | | <u>අනුකූල නොවීම</u> |
|---|---|---|
| (අ) 2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | | සාර්ථක පර්යේෂණ හා නවිකරණයන් සඳහා ජාතික මට්ටමේ පිළිගැනීම් හා ප්‍රදානයන් සිදු කෙරෙන ක්‍රම ඇති කිරීමට කටයුතු කර නොතිබූ අතර 2007 සිට 2010 දක්වා වූ වර්ෂ වෙනුවෙන් ජනාධිපති සම්මාන උළෙලවල් පවත්වා නොතිබුණි. |
| (ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත | (i). | අදාළ අරමුදල් වලට දායක මුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනා ඇතුළත් වැටුප සැලකිල්ලට ගතයුතු වුවත් පර්යේෂණ සභාවේ සේවය කරන සේවකයින් 4 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව රහිත මූලික වැටුපට දායක මුදල් ගණනය කර තිබුණි. |
| | (ii). | කාර්ය පැවරුම් පදනම මත සේවය කළ නිලධාරීන් දෙදෙනෙකු සඳහා අදාළ අරමුදල් වලට දායක මුදල් ගෙවා නොතිබුණි |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | නියම කර ඇති පරිදි ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |

2.2.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ). පර්යේෂණ ප්‍රදාන සඳහා ලැබුණු අරමුදල් වලින් පර්යේෂණ සභාවට රු.781,819 ක් වටිනා ස්ථාවර වත්කම් මිළදී ගෙන තිබුණි.

(ආ). (i). සමාලෝචිත වර්ෂය තුල ඉන්ධන හා ප්‍රවාහන වෙනුවෙන් පහත පරිදි වියදම් දරා තිබුණි.

| | රු. |
|---|---|
| සභාපතිගේ ඉන්ධන දීමනාව | 217,500 |
| ඉන්ධන ප්‍රතිපූර්ණය | 388,874 |
| | 606,374 |

මීට අමතරව දේශීය ප්‍රවාහන වියදම් ලෙස රු.149,750 ක්ද ඉන්ටෙන්ට්‍රි පරීක්ෂාව සඳහා ප්‍රවාහන ගාස්තු ලෙස රු.103,950 ක්ද දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ප්‍රවාහන වියදම් ලෙස රු.133,275 ක්ද වැය කර තිබුණි. සභාවේ කාර්ය මණ්ඩලය හා කාර්ය භාරය සැළකිමේදී ප්‍රවාහන වියදම් වෙනුවෙන් අධික මුදලක් වැය කර ඇති බව නිරීක්ෂණය විය.

(ii). දෛනික ධාවන සටහන් විධිමත් ලෙස නඩත්තු කර නොමැති බැවින් ඉන්ධන භාවිතයේ නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු.18,148,802 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.14,902,659 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.3,246,143 ක අඩුවීමක් දක්නට ලැබුණි. මෙයට බලපෑ ප්‍රධාන හේතු වූයේ වෙනත් වියදම් මිලියන 2.5 කින් වැඩිවීමත්, ක්ෂය හා ක්‍රමක්ෂය මිලියන එකකින් වැඩිවීමත් වේ.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ). 2000/2001 වර්ෂවල ලබාදී තිබුණු පර්යේෂණ ප්‍රදාන වලින් නිමවූ ව්‍යාපෘති 10කට අදාළව මිළදී ගත් රු.20,890,325 ක් වටිනා ස්ථාවර වත්කම්/උපකරණ අදාළ පර්යේෂණ ආයතනයට පවරා දීමට හෝ නැවත ජාතික පර්යේෂණ සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). පර්යේෂණ ප්‍රදාන ගිවිසුමේ 5 පරිච්ඡේදයට අනුව පර්යේෂකයින්ට ලබාදෙන පර්යේෂණ උපකරණ පිළිබඳ තොරතුරු ජාතික පර්යේෂණ සභාවේ ඉන්වෙන්ට්‍රි ලේඛනයක සටහන් කරගත යුතු අතර ප්‍රධාන පර්යේෂකයා, පර්යේෂණ සභාවේ නිලධාරියෙක් සහ අදාළ ආයතනයේ වගකිව යුතු නිලධාරියෙක් එහි අත්සන් කළ යුතුය. සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.28,296,195 ක් වටිනා පර්යේෂණ උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ). පහත සඳහන් ව්‍යාපෘති නිමකළ යුතු කාල සීමාව අවසන්වී ඇති හෙයින් බැංකු ගිණුම්ද වසා තිබූ අතර අවසන් පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

| ව්‍යාපෘති අංකය | පර්යේෂකයාගේ නම | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | ව්‍යාපෘතිය අවසන් කළයුතු දිනය | ව්‍යාපෘති ප්‍රදානයේ වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු. |
| 05-66 | පී.පී.එස්.එල්.පතිරත්න මයා | 2006.07.15 | 2009.07.15 | 1,997,222 |
| 06-22 | එස්.එම්.පී.රුවන්පුර මයා | 2008.04.01 | 2011.04.01 | 2,299,611 |
| 06-65 | එම්.ආර්.චන්ද්‍රරත්න මයා | 2007.11.01 | 2010.10.29 | 549,000 |
| 07-10 | අයි.රාජපක්ෂ මයා | 2009.12.30 | 2011.03.30 | 3,629,000 |
| | | | | 8,474,833 |

4.2 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ). සමාලෝචිත වර්ෂයේදී රු.208,075,203 ක මුදලක් පර්යේෂණ ව්‍යාපෘති 51 ක් වෙනුවෙන් ජංගම ගිණුම්වල තැන්පත් කර තිබුණි. 2011 දෙසැම්බර් 31 දින වනවිටත් මින් පාවිච්චි කර තිබුණේ රු.1,269,919 ක් වන අතර එය මුළු මුදලින් 0.61% විය. රු.40,463,000 ක් ලබාගත් පර්යේෂකවරු 12 දෙනෙකු පර්යේෂණ කටයුතු සඳහා කිසිදු මුදලක් උපයෝගී කරගෙන නොතිබුණි.

(ආ). පර්යේෂණ ප්‍රදාන ලබාගත් ඇතැම් පර්යේෂකයන් තම පර්යේෂණ ව්‍යාපෘති අත්හැර දැමූ අවස්ථා නිරීක්ෂණය විය. පර්යේෂකයෙකුට ප්‍රදානය ලබාදෙන මුල් අවස්ථාවේම අදාළ පර්යේෂණ ව්‍යාපෘතිය නමින් වූ ජංගම ගිණුමකට අනුමත මුළු මුදලම බැර කරන අතර, පර්යේෂණය අත්හැර දැමීම නිසා බැංකු ගිණුම වසා දැමීමට හෝ අරමුදල් හා උපකරණ වෙනත් ව්‍යාපෘතියකට මාරු කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත කර තිබීම හේතුවෙන් එම මුදල් වර්ෂ 3-4 කාලයක් අක්‍රියව තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රදාන අංකය | බැංකුගත කරනු ලැබූ මුදල | බැංකු ගිණුම ආරම්භ කළ දිනය | බැංකු ගිණුම වැසූ දිනය | බැංකු ගිණුමේ මුදල් අක්‍රියව තිබූ කාලය |
|---|---|---|---|---|
| ------- | ----------------- | ------------- | ------------- | ----------------- |
| | රු. | | | |
| 05-18 | 439,800 | 2006.06.19 | 2010.09.15 | අවු.04 මාස 03 |
| 06-41 | 1,998,000 | 2007.11.17 | 2011.12.17 | අවු.04 මාස 01 |
| 06-52 | 1,139,186 | 2007.11.17 | 2010.03.25 | අවු.02 මාස 04 |
| 06-54 | 831,917 | 2007.11.17 | 2010.03.25 | අවු.02 මාස 04 |
| 07-48 | 2,299,000 | 2009.05.25 | 2011.12.17 | අවු.02 මාස 07 |
| 07-57 | 2,550,000 | 2009.05.25 | 2011.09.09 | අවු.02 මාස 04 |
| 08-44 | 2,335,000 | 2010.11.29 | 2011.12.17 | අවු.01 මාස 01 |
| 09-44 | 1,697,740 | 2009.01.19 | 2011.08.29 | අවු.02 මාස 07 |
| 09-11 | 2,896,000 | 2010.11.29 | 2011.12.17 | අවු.01 මාස 01 |
| 09-32 | 1,700,000 | 2010.10.18 | 2011.12.17 | අවු.01 මාස 02 |

4.3 හඳුනාගත් පාඩු

වයඹ විශ්වවිද්‍යාලයට ලබාදුන් ප්‍රදාන අංක 5-29 පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රු.1,219,000 කට මිලදී ගත් Spectrometer ක්‍රියාවිරහිත වීම නිසා අදාළ ආයතනයට 2009 ජුලි 20 දින ආපසු භාරදී තිබූ අතර, 2011 දෙසැම්බර් 31 දින වනවිටත් රු.150,896 ක් හිඟ හිට තිබුණි. මෙම යන්ත්‍රය මිලදී ගැනීමේදී වැට් බදු වශයෙන් ගෙවන ලද රු.159,000 ක මුදල අයකර ගත නොහැකි වූ බැවින් එම මුදල ආදායම්/වියදම් ගිණුමට කපා හැර තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ රැස්වීම් 4 ක් පමණි.

5.2 සංයුක්ත සැලැස්ම

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3. ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, සභාවේ සියළු කාර්යයන් ආවරණය වන පරිදි පිළියෙල් කර නොතිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැති අතර, අභ්‍යන්තර විගණනය සඳහා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ සහාය ලබාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ). පර්යේෂණ ප්‍රදාන

(ආ). වාහන පාලනය

එච්.ඒ.එස්.සමරවීර,

විගණකාධිපති.